# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
# -2007-

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

# වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

# 2007

...

2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ

10 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී

**වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

**2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ**

**10 වෙනි වගන්තිය යටතේ ගරු මුදල් ඇමතිතුමා විසින් නිකුත් කරන ලදී**

2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වෙනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාල වර්ෂයේ ජුනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ .

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායට අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2007 වසරේ පලමු මාස හතර තුල රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ ක්‍රියාකාරකම් සහ ණය ගැනීම් මෙම වාර්තාවේ ඇතුලත් වේ. ඒ අතරම, සාර්ව ආර්ථික කාර්ය සාධනය, මිල ගණන් පිළිබඳ වර්ධනයන්, රැකියා නියුක්තිය, විදේශ ආධාර, රාජ්‍ය ණය, ගෙවුම් ශේෂය සහ මුදල් හා ණය වර්ධනයන් පිළිබඳ ලබා ගත හැකි තොරතුරු අනුව යාවත්කාලීන දත්තද මෙම වාර්තාවේ ඇතුලත් වේ.

# 1 වන පරිච්ඡේදය

# රාජ්‍ය මූල්‍ය උපනතීන්

**අයවැය හිඟය මනා පාලනයකට**

- බදු ආදායමේ සියයට 30 ක වර්ධනයක් ද සහිතව රජයේ ආදායමේ සියයට 29 ක වර්ධනයක් 2007 වසරේ පළමු මාස හතර තුළදී පෙන්නුම් කෙරිණි. වැටුප්, විශ්‍රාම වැටුප්, ජාතික ආරක්ෂාව සහ මෑතකදී ත්‍රස්තවාදීන් ගැටුම් වලින් මුදාගත් ප්‍රදේශයන්හි මානුෂීය සහන කටයුතු සහ එසේම මෙම වසර සඳහා සියයට 7 ක පමණ වර්ධන අනුපාතයක් පවත්වා ගැනීමට සහය වන මට්ටමකින් රාජ්‍ය ආයෝජන පවත්වා ගැනීම සඳහා වන වියදම් වල වැඩිවීමක් තිබියදීත්, මෙම කාල පරිච්ඡේදය තුළදී සමස්ථ වියදමේ වැඩි වීම සියයට 8 ක පමණ මට්ටමක පවත්වා ගනු ලැබිණි.

- මෙම කාල පරිච්ඡේදය තුළදී ඉපයූ ආදායම සමස්ථ වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 28 ක් වූ අතර, එය 2006 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේදී වාර්තා වූ ප්‍රමාණයට ආසන්න වශයෙන් සමාන විය. 2006 වසරේ පළමු මාස හතර තුළ අයවැය ගත අගයන්ගෙන් සියයට 33 ක් වූ පුනරාවර්තන වියදම හා සසඳන කල 2007 වසරේ එම අගය සියයට 31 ක් විය.

- ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස, 2007 වසරේ පළමු මාස හතර සඳහා රජයේ ආදායම සියයට 5.3 ක් වූ අතර 2006 වසරේ අදාල කාල පරිච්ඡේදයේදී එය සියයට 4.7 ක් විය. 2006 වසරේ අදාල කාල පරිච්ඡේදයේදී ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 8 ක් වූ මුළු වියදම හා සසඳන විට 2007 වසරේ දී එම අගය සියයට 7.6 ක් විය. ආදායම් කාර්යයසාධනය වැඩි දියුණු වීම සහ පුනරාවර්තන වියදම්හි වර්ධනය අඩු වීම පිළිබිඹු කරමින්, 2006 වසරේ පළමු මාස හතර තුළ ද.දේ.නි. න් සියයට 1.5 ක් වූ ආදායම් ගිණුමේ හිඟය 2007 වසරේ දී සියයට 0.5 දක්වා අඩු වී ඇත.

- රාජ්‍ය මූල්‍ය උපනතීන්හි තවත් සැලකිය යුතු ලක්ෂණයක් වූයේ, 2006 වසරේ පළමු මාස හතර තුළදී බැංකු අංශයෙන් ලබාගත් රු. බිලියන 18.3 ක ශුද්ධ ණය ගැනීම් වලට සාපේක්ෂව 2007 වසරේ අදාල කාලපරිච්ඡේදයේදී ශුද්ධ ණය ආපසු ගෙවීම් රු. බිලියන 27 ක් වීමය.

- තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් දිරි ගැන්වීම පිණිස, උද්ධමන පීඩනය පාලනය කිරීමට මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ඇතුළු ගනු ලැබූ අනෙකුත් ක්‍රියා මාර්ග මෙම උපනතීන් අනුපූරණය කරනු ලැබීය.

- පොළී අනුපාතයන්ගේ තියුණු ඉහළ යෑම සහ අනපේක්ෂිත උච්චාවචනයන් හේතුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් මත සැලකිය යුතු අමතර පීඩනයක් ඇති කරන ලද තත්ත්වයක් තුළ, ආදායම් වැඩි කිරීම මගින් රාජ්‍ය මූල්‍ය කටයුතු තව දුරටත් ඒකාග්‍ර කිරීම, එම පීඩනයන් අඩු කිරීම සඳහා සහාය විය.

- 2007 වසරේ ජනවාරි සිට ජූනි මස දක්වා කාලය තුළදී වෙළෙඳපොල සාධන පත්‍ර මගින් රජයේ ණය මෙහෙයුම් කටයුතු රු. බිලියන 67.2 කින් ඉහළ ගියද, එය පසුගිය වසරේ පළමු මාස හය තුළ වාර්තා ගත අගයට වඩා රු. බිලියන 2 ක වැඩි වීමක් පමණි. භාණ්ඩාගාර බැඳුම්කර හරහා විදේශිකයන්ට නිකුත් කළ ණය ඉවත් කළ විට, අයවැය මෙහෙයුම් මගින් දේශීය මූල්‍ය සම්පත් මත ඇති වන පීඩනය ඉවත් කරමින් දේශීය ප්‍රභවයන්ගේ ශුද්ධ ණය ගැනීම කැපී පෙනෙන පහළයාමක් පෙන්නුම් කරයි.

## **I.1** වගුව

### අයවැය සාරාංශය (ජනවාරි-අප්‍රේල්)

| | | රු .මිලියන |
|---|---|---|
| | **2006** | **2007** |
| **ආදායම** | **130,977** | **170,374** |
| බදු | 118,086 | 153,945 |
| බදු නොවන | 12,891 | 16,429 |
| **වියදම** | **226,456** | **244,638** |
| පුනරාවර්තන | 174,709 | 185,675 |
| රාජ්‍ය ආයෝජන | 54,987 | 63,775 |
| අනෙකුත් | -3,239 | -4,812 |
| **ආදායම් ගිණුම** | **-43,732** | **-15,302** |
| **සමස්ථ ශේෂය** | **-95,488** | **-74,264** |
| මූල්‍යයනය | 95,483 | 74,264 |
| ප්‍රදාන | 7,325 | 10,878 |
| විදේශ ණය | 11,406 | 25,826 * |
| දේශීය මූල්‍යයනය | 76,749 | 37,560 |
| බැංකු නොවන | 58,367 | 64,873 |
| බැංකු | 18,382 | -27,313 |
| ආදායම/ ද.දේ.නි.(%) | 4.7 | 5.3 |
| පුනරාවර්තන වියදම/ද.දේ.නි.(%) | 6.2 | 5.7 |
| රාජ්‍ය ආයෝජන/ද.දේ.නි (%) | 2.0 | 2.0 |
| ආදායම් හිඟය/ද.දේ.නි. (%) | 1.5 | 0.5 |
| සමස්ථ අයවැය හිඟය/ද.දේ.නි. (%) | 3.4 | 2.3 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

*** භාණ්ඩාගාර බැඳුම්කර මත විදේශීය ආයෝජන ඇතුළත්ය.**

# රාජ්‍ය ආදායම

**ඉහළ ආදායමක් අරමුණු කළ බදු ප්‍රතිපත්ති වෙනස්කම්**

- පසුගිය වසර 3 හි පෙන්නුම් කළ ඉහළ ආදායම් උත්පාදනය තිරසාර කිරීම සහ එය තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස, ආයෝජන දිරිගන්වන පරිසරයක් සහතික කරමින් බදු පදනම පුළුල් කිරීම, බදු අනුපාත සංශෝධනය සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කීහිපයක් ක්‍රියාත්මක කරනු ලැබිණි.

- 2007 වසරේ ජනවාරි සිට මැයි මස දක්වා කාල පරිච්ඡේදය තුළදී ඉපයූ රජයේ ආදායම රු. මිලියන 218,034 ක් වූ අතර එය පසුගිය වසරේ අදාල කාල පරිච්ඡේදය තුළ ඉපයූ ආදායමට වඩා සියයට 27 ක වර්ධනයක් විය. ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස, එය සියයට 6.7 දක්වා වැඩි වූ අතර බදු ආදායම සියයට 5.2 සිට සියයට 6.0 දක්වා වැඩි විය. පළමු මාස පහ තුළ ආදායම් කාර්ය සාධනය සැළකීමේදී, එය වාර්ෂික අයවැයගත ඉලක්ක ළඟා කර ගැනීමේ හැකියාව පෙන්නුම් කරයි.

**1.2 වගුව**

**ආදායම් කාර්යසාධනය – (ජනවාරි - මැයි)**

**රු. මිලියන**

| | 2006 | 2007 | වර්ධනය % |
|---|---|---|---|
| **බදු ආදායම** | **153,460** | **195,084** | **27** |
| ආදායම් බදු | 24,768 | 41,143 | 66 |
| එකතු කළ අගය මත බදු | 59,879 | 72,573 | 21 |
| නිෂ්පාදන බදු | 35,474 | 37,305 | 5 |
| මුද්දර බදු | 24 | 1,469 | |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | 7,503 | 9,850 | 31 |
| ආනයනය බදු | 20,487 | 22,697 | 11 |
| අනෙකුත් | 5,325 | 10,047 | 88 |
| **බදු නොවන ආදායම** | **18,917** | **22,950** | **21** |
| **මුළු ආදායම** | **172,377** | **218,034** | **27** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## 1.1 රූපසටහන




**ආදායම් බදු ආදායමේ අඛණ්ඩ වර්ධනයක්**

- 2007 වසරේ පළමු මාස පහ තුළදී, සමාගම්හි ලාභ මත බද්ද, පුද්ගල ආදායම් බද්ද, පොළී ආදායම මත බද්ද සහ ආර්ථික සේවා ගාස්තුව මගින් ලැබූ මුළු ආදායම රු. මිලියන 41,173 ක්වූ අතර පසුගිය වසරේ අදාල කාලපරිච්ඡේදය හා සසඳන විට එය සියයට 66 ක කැපි පෙනෙන වර්ධනයකි.

- පසුගිය වසර තුන තුළදී බදු පදනම පුළුල් කිරිම, බදු අනුපාත සංශෝධනය සහ බදු පරිපාලනය වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් සහ බදු පරිපාලනයේ ඉහළ කැපවීම මෙම වර්ධනයට දායක විය.

- ආදායම් බදු ආදායම වැඩි කිරීම සහ මැදි කාලයේදී ද. දේ. නිෂ්පාදිතයෙන් සියයට 3.5 කට පමණ ළඟාවීම පිණිස, 2007 අප්‍රේල් 01 දින සිට බලාත්මක වන පරිදි තවත් ක්‍රියාමාර්ග සමහරක් 2007 අයවැය මගින් හඳුන්වා දුනි.

**ආදායම් බදු වෙනස්කම්**

**බදු පදනම පුළුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග**

- රක්ෂණ ව්‍යාපාරයක ලාභ හා ආදායම නිශ්චය කිරීමේදී ජීවිත රක්ෂණ සහ අනෙකුත් රක්ෂණ එකිනෙකින් ස්වාධීන වූ ව්‍යාපාර ලෙස සළකනු ලැබේ. එක් රක්ෂණ ව්‍යාපාරයකින් ලබන අලාභ එම රක්ෂණ ව්‍යාපාරයෙන් ලබන ලාභ වලින් පමණක් හිලවු කළ හැකි වේ.

- 2007 අප්‍රේල් 01 දින හෝ ඉන්පසු ආරම්භ වන ඕනෑම බදු වර්ෂයක් සඳහා, යම් සමාගමක් බෙදා හරිනු ලබන දළ ලාභාංශ, එම වසර සඳහා එහි බෙදාහැරිය හැකි ලාභයෙන් සියයට 25 කට වඩා අඩු වන අවස්ථාවකදී දැනටමත් බෙදා හැර ඇති ලාභය ට වඩා, බෙදාහැරිය හැකි ලාභයෙන් 1/3 දක්වා වූ අතිරේක ප්‍රමාණය මත සියයට 15 ක අමතර බද්දක් එම සමාගම ගෙවිය යුතු වේ.

- යම් සමාගමක්, සමූහ ව්‍යාපාරයක පරිපාලිත සමාගමක් හෝ සමූහ ව්‍යාපාරයක උප සමාගමක් හෝ යම් ආශ්‍රිත සමාගමක් වන අවස්ථාවේදී සියයට 15 ක සහනදායි අනුපාතය අදාල නොවේ.

- බොල් ණය ප්‍රතිපාදනයේ සත්‍ය ප්‍රමාණය හෝ වර්ෂය අවසානයේ තිබෙන ණයගැති ශේෂයෙන් සියයට 1 යන දෙකෙන් අඩු අගයට සීමා වන සේ බැංකුවක හෝ මූල්‍යායාතනයක බොල් ණය සම්බන්ධයෙන් වන වෙනස්කම් හඳුන්වා දුනි.

- ව්‍යාපාරය ආරම්භයේ සිට වසර තුනක් සඳහා ආර්ථික සේවා ගාස්තුව අය නොකිරීම නිෂ්පාදන කාර්යයයේ නිරත ව්‍යාපාර සඳහා පමණක් සීමා කරනු ලැබීය.

- ආර්ථික සේවා ගාස්තුව අයකිරීමට අදාල පිරිවැටුමේ සීමාව කාර්තුවකට රු.මිලියන 10 සිට රු.මිලියන 7.5 දක්වා අඩු කෙරිණි.

**අනුපාත වෙනස්කම්**

- තේ, දිසදි පොල්, රබර්, ෂීට් රබර් ආදියෙහි එකතු කළ වටිනාකම සහිත නිශ්පාදිත නිපදවීමේ කර්මාන්ත, මැණික්/ දියමන්ති, ස්වර්ණාභරණ සහ ඇඟලුම් අපනයන, අන්තරාල වෙළඳාම, සහ ඒකක භාර වැනි අංශයන්හි ආර්ථික සේවා ගාස්තුව සම්බන්ධයෙන් අනුපාත අඩු කිරීම් කිහිපයක් හඳුන්වා දෙන ලදී.

**නිදහස් කිරීම්/අනෙකුත් සංවර්ධන ක්‍රියාමාර්ග**

- ඒකක භාර කර්මාන්තය ජනප්‍රිය කිරීම සඳහා කොටස් විකිණීම මගින් උපයන ලාභ සඳහා බදු නිදහසක් ලබා ගැනීමට ඒකක භාරයන්ට අවස්ථාව දෙනු ලැබිණි.

- හවුල් ව්‍යාපාර සඳහා අදාල බදු නිදහස් සීමාව රු. 600,000 දක්වා ඉහල නංවනු ලැබූ අතර රු. 600,000 ට වඩා වැඩි බෙදිය හැකි ලාභය මත පමණක් සියයට 10 අනුපාතය අදාල කරනු ලැබිණි.

- මෑතදී ඉදිකළ සිනමා ශාලා සහ පැවති සිනමා ශාලා සඳහා බදු නිදහස් කාල සීමාවක් ලබා දෙන ලදී. සිනමා කර්මාන්තයේ අභිවෘද්ධිය පිණිස, චිත්‍රපට නිෂ්පාදන පිරිවැය මත ආදායම් බද්දෙන් අඩුකර ගත හැකි සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව රු. මිලියන 10 සිට රු. මිලියන 25 දක්වා වැඩි කෙරිණි.

- ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා කර්මාන්තයක් ලෙස නාවික කටයුතු කර්මාන්තය සංවර්ධනය කරනු පිණිස, අත්පත් කර ගන්නා නැව් සම්බන්ධයෙන් ප්‍රාග්ධන දීමනාව සියයට 33 1/3 දක්වා ඉහළ දැමීම සහ ශ්‍රී ලාංකික නැවක සේවා නියුක්ත නේවාසික පුද්ගලයෙකුගේ පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිණි.

- ශ්‍රී ලංකාවෙන් පිටත ඉදිකිරීම් කටයුතු කරනු ලබන ශ්‍රී ලාංකිකයන් දිරිමත් කිරීම සඳහා සහ එවැනි ඉපයීම් නිල මාර්ගයන් මගින් මෙරටට ප්‍රේෂණය කිරීම

ධෛර්යමත් කිරීම සඳහා, විදේශ ව්‍යවහර මුදලින් ගෙවීම් ලබන සහ එම ඉපයීම් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන, ශ්‍රී ලංකාවෙන් පිටත ඉදිකිරීම් කටයුතු වල නිරත වන පුද්ගලයෙකුගේ ලාභ, අදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිණි

- ඉදිකිරීම් කර්මාන්තයේ භාවිතා කරන යන්ත්‍රසූත්‍ර මත ක්ෂයවීමේ දීමනාව සියයට 12.5 සිට සියයට 25 දක්වා වැඩි කරනු ලැබීය.

- බැංකු සහ අනෙකුත් මූල්‍යායතන මගින් පුද්ගලයෙකුට උපචිත වන පොලිය මත අය කරන රඳවා ගැනීමේ බද්ද සරල හා සාධාරණ කරනු ලැබීය.

- විශේෂයෙන් වසර 20 කින් පසු විශ්‍රාම යන සේවකයන් සම්බන්ධයෙන්, බදු ආදායමේ අනුපාතයට අයත් මට්ටම් පුළුල් කිරීම මගින් විශ්‍රාම යන සේවකයින්ගේ ආන්තික ප්‍රතිලාභ සඳහා සහන ප්‍රදානය කරනු ලැබීය.

- ව්‍යාපාර සංවර්ධනයෙහි සේවා / සේවක හවුල්කාරත්වයන් දිරිගැන්වීමට "සේවකයන් වෙත කොටස් හිමිකම් පැවරීමේ වැඩසටහන" ට සහභාගිවීමෙන් ලබන ප්‍රතිලාභ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීය.

**පරිපාලනමය වෙනස්කම්**

- හිඟ බදු නිරවුල් කිරීම පිණිස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සමග එකඟ වූ වාරික සැලසුමකට අනුව වසර 03 කට නොවැඩි කාලපරිච්ඡේදයක් තුල බදු පැහැර හැර ඇති තැනැත්තෙකු පැහැර හරිනු ලැබූ බද්ද ගෙවයි නම්, 2005 මාර්තු 31 දින හෝ ඊට පෙර අවසන් වන්නාවූ බදු වර්ෂයක් සඳහා යම් ආදායම් බදු ප්‍රමාණයක් නොගෙවීම වෙනුවෙන් එකතු වූ දඩ මුදල ගෙවීම අත්හැරීමට කොමසාරිස් ජනරාල් ට බලය පැවරුණි.

**එකතු කළ අගය මත බදු (එ.අ.බ.) ආදායමේ මධ්‍යස්ථ වර්ධනය**

- 2007 මැයි දක්වා එ.අ.බ. ආදායම රු.මිලියන 72,573 ක් වූ අතර එය පසුගිය වසරේ අනුරූපී කාලපරිච්ඡේදය හා සසඳන විට සියයට 21 ක වර්ධනයකි. ආනයනික වාහනවල වටිනාකමෙහි පහළ වර්ධනය, විභවතාවයට පහළ මට්ටමකින් ක්‍රියාත්මක සංචාරක කර්මාන්ත වැනි සේවා සහ මත් පැන් හා දුම්වැටි අලෙවියෙහි අඩු වර්ධනය, එකතු කළ අගය මත බදු ආදායම් රැස් කිරීමේ මධ්‍යස්ථ වර්ධනයට හේතු විය.

**1.3 වගුව**

**එ. අ. බ. කාර්ය සාධනය (ජනවාරි - මැයි)**

**(රු.මිලියන)**

| බදු පදනම | 2006 | 2007 | වර්ධනය % |
|---|---|---|---|
| දේශීය | 32,355 | 36,286 | 12 |
| ආනයන | 32,537 | 40,519 | 25 |
| **දළ ආදායම** | **64,892** | **76,805** | **18** |
| ප්‍රතිගෙවුම් | 5,013 | 4,232 | -16 |
| **ශුද්ධ ආදායම** | **59,879** | **72,573** | **21** |
| ප්‍රති ගෙවුම් දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 7.7 | 5.5 | |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**එකතු කළ අගය මත බදු වෙනස්කම්**

**බදු පදනම පුළුල් කිරීම**

- බද්දට අදාල කාල පරිච්ඡේදය සඳහා ඉඩදී ඇති යෙදවුම් බද්ද හෝ ප්‍රකාශිත නිමවුම් බද්දෙන් සියයට 85 හෝ යන දෙකෙන් අඩු අගයට යෙදවුම් බදු බැර සීමා කෙරිණි.

- බදු හරපත් මත යෙදවුම් බද්දේ ගැලපීම්, මුල් පිටපත නිකුත් කරනු ලැබූ දිනයේ සිට මාස 06 ක් ඇතුලත නිකුත් කළ එවැනි හරපත් සඳහා සීමා කරනු ලැබිණ.

- භාණ්ඩ ආනයනයේදී මි.ර.ගැ.(CIF) වටිනාකම මත ආන්තික ලාභය සියයට 7 සිට 10 දක්වා වැඩි කෙරිණි.

- ගමනාගමනය සඳහා යොදා ගන්නා මෝටර් වාහන මත ඉඩ දී තිබූ සියයට 50 බදු බැර සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබීය.

- රජයේ ආයතන සඳහා සපයන සැපයුම් මත, කොන්ත්‍රාත්කරුවෙකුට හෝ යම් සේවා සපයන්නෙකුට ගෙවිය යුතු එකතු කළ අගය මත බද්දෙන් 1/3 ක් රඳවා ගැනීමට ප්‍රතිපාදන සලසා ඇත.

- රු. මිලියන 1.8 ක් වන එකතු කළ අගය මත බද්දට යටත් වන සීමාවේ සිටින තැනැත්තන්ට සියයට 5 ක ආපසු නොගෙවන එකතු කළ අගය මත බද්දක් ගෙවීමට ප්‍රතිපාදන සලසනු ලැබීය.

**අනුපාත වෙනස්කම්**

- අධි තාක්ෂණික වෛද්‍ය උපකරණ ආනයනය සහ සැපයීම මත සියයට 15 සිට සියයට 5 දක්වා එකතු කළ අගය මත බද්ද අඩු කෙරිණි.

- මුංඇට, කඩල සහ ටිංමාලු ආනයනය සහ සැපයීම මත සියයට 15 සිට සියයට 5 දක්වා එකතු කළ අගය මත බදු අනුපාතය අඩුකරනු ලැබීය.

- ස්වර්ණාභරණ සැපයීම මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 20 සිට සියයට 5 දක්වා අඩු කරනු ලැබීය.

**නිදහස් කිරීම් / අනෙකුත් සංවර්ධන ක්‍රියාමාර්ග**

- විශේෂයෙන් නිෂ්පාදනය සහ අගය එකතු කළ වටිනාකම සහිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා තරඟකාරී තත්ත්වයන් තුළ යෙදවුම් සැපයීමේ අරමුණින් කර්මාන්ත සඳහා අදාල වන විදුලි ගාස්තු අඩු කිරීමට, ජාතික පද්ධතියට විදුලිය සපයන පෞද්ගලික විදුලි බල සැපයුම්කරුවන් සහ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ආනයනය කරන දැවි තෙල්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ විදුලිය සැපයීම බද්දෙන් නිදහස් කෙරිණි.

- දේශීය නිෂ්පාදකයන්ට සහාය වීම සඳහා ඉස්සන් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කළ අතර, පශු සම්පත් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සතුන්ගේ සුලභතාව වැඩි කිරීම සඳහා ගව, මීගව ආදී සතුන් සහ පශු සම්පත් අභිජනනය සඳහා අවශ්‍ය අයිතමයන් ද බද්දෙන් නිදහස් කරන ලදී. එම අදාල අංශයන්හි අභිවෘද්ධිය පිණිස, වතු වගා අංශයේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ආනයනය සහ සම් භාණ්ඩ නිෂ්පාදන, සැකසීම සහ නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදි.

- සිනමා කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා චිත්‍රපට නිෂ්පාදනය, බෙදාහැරීම හා ප්‍රදර්ශනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරනු ලැබූ අතර, විදේශ විනිමය ඉපැයීම්, සේවා නියුක්තිය වැඩි කිරීම සඳහා ප්‍රමුඛතා කර්මාන්තයක් ලෙස නාවික කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට නැව් ආනයනය සහ කුලියට ගැනීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරිණි.

**නිෂ්පාදන බදු ආදායමේ අඩු වර්ධනයක්**

- මත්පැන්, දුම්වැටි, ඛණිජ තෙල් නිෂ්පාදන, මෝටර් වාහන සහ පාරිභෝගික කල් පවත්නා භාණ්ඩ මත නිෂ්පාදන බද්දෙන් ලැබූ ආදායම රු.මිලියන 37,305 ක් දක්වා 2007 පළමු මාස 05 තුළදී සියයට 5 කින් ආන්තිකව වැඩි විය.

- මත්පැන් හා දුම්වැටි වල බදු අනුපාතය සංශෝධනය කළද, සැර මත්පැන් නිෂ්පාදනයන්ගේ පහල වර්ධනය, දුම්වැටි අලෙවියේ පහල යාම සහ වාහන ආනයනයන්හි වටිනාකමේ වර්ධනයේ පහළ යාම නිෂ්පාදන බදු එකතු කිරීමේ පහල වර්ධනයට හේතු විය. 2006 අනුරූපී කාලපරිච්ඡේදයේ සියයට 21 වර්ධනය හා සසඳන විට සැර මත්පැන් නිෂ්පාදනය වර්ධනය වූයේ සියයට 9 කිනි. දුම්වැටි අලෙවියද සියයට 2 කින් පහළ වැටිණි.

**1.4 වගුව**

**නිෂ්පාදන බදු කාර්ය සාධනය (ජනවාරි - මැයි)**

**(රු.මිලියන)**

| අයිතමය | 2006 | 2007 | වර්ධනය % |
|---|---|---|---|
| මත්පැන් | 8,483 | 9,639 | 14 |
| දුම්වැටි | 12,621 | 12,134 | -4 |
| ඛණිජ තෙල් නිෂ්පාදන සහ වාහන | 13,297 | 14,123 | 6 |
| අනෙකුත් | 1,073 | 1,409 | 31 |
| **එකතුව** | **35,474** | **37,305** | **5** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**නිෂ්පාදන බදු වෙනස්කම්**

**අනුපාත වෙනස්කම්**

- බීර හැර මත්පැන් සහ තෝරාගත් දුම්වැටි වර්ගයන් මත නිෂ්පාදන බද්ද වැඩි කෙරිණි.

- පොලිතීන් සහ තීන්ත මත සියයට 5 ක නිෂ්පාදන බද්දක් පනවනු ලැබිණි.

බදු පදනම පුළුල් කිරීම

- පැවති අඩුලුහුඩුතා ඉවත් කිරීම සඳහා වාහන සඳහා අදාල සංයෝජිත කාණ්ඩ අංක සංශෝධනය කරනු ලැබීය.
- 2006 නොවැම්බර් සිට බලපැවැත්වෙන පරිදි රේගුවේදී අයකරන නිෂ්පාදන බද්ද සඳහා අදාල මි.ර.ගැ. (CIF) මත ආන්තික ලාභය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කෙරිණි.

නිදහස් කිරීම් / අනෙකුත් සංවර්ධන ක්‍රියාමාර්ග

- මුද්‍රණ සහ ඇසුරුම් කර්මාන්තයන් සඳහා අවශ්‍ය ඇතැම් අයිතම මත නිෂ්පාදන බද්ද නිදහස් කෙරිණි.
- කුඩා පරිමාණයේ තීන්ත නිෂ්පාදකයන්ට සහය වීම සඳහා, රු.මිලියන 50 අඩු පිරිවැටුමක් සහිත නිෂ්පාදකයන්ට බදු නිදහසක් ලබාදෙමින් තීන්ත නිෂ්පාදනය මත පැනවූ නිෂ්පාදන බද්ද අඩු කෙරිණි.
- සහනදායි බදු අනුපාතයක් යටතේ වාහන ආනයනය කිරීමට රජයේ සේවකයන් සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

බාහිර වෙළඳාම මත බදු ආදායමේ මධ්‍යස්ථ වර්ධනයක්

- 2007 ජනවාරි සිට මැයි කාල පරිච්ඡේදය තුලදී ආනයනය බදු ආදායම රු. මිලියන 22,697 ක් වූ අතර, 2006 වසරේ අදාල කාලපරිච්ඡේදය හා සසඳන කළ එය සියයට 11 ක වර්ධනයක් වේ. කෙසේවුවද, ජීවන වියදම පාලනය කිරීමට ඇතැම් භාණ්ඩ සඳහා ලබා දුන් ආනයන බදු අත්හැරීම්, ආනයනය කරනු ලබන මෝටර් වාහන අතරින් අඩු වටිනාකමකින් යුත් මෝටර් වාහන ආනයනය කිරීමේ ප්‍රවණතාවය වැඩි වීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් හේතුවෙන් බොහෝමයක් තීරු අංක, අඩු තීරු බදු අනුපාත යටතේ වර්ග කිරීම ආදියෙන් සමන්විත පසුබිමක් යටතේ මෙම වර්ධනය අත්කර ගනු ලැබිණි.

- මිල අඩුවෙන් පෙන්වීම අවම කිරීම සඳහා වූ පරිශ්‍රමයන් අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, ටයර්, රසකැවිලි නිෂ්පාදන වැනි ඇතැම් අයිතම නිශ්චිත බද්දකට යටත් කරන ලදී. එසේම රේගු සංනිරීක්ෂණ යාන්ත්‍රනයන්ද තීරු බදු එකතු කිරීම වැඩිදියුණු කිරීමට දායක විය.

- 2007 මැයි අග වන විට අත්‍යවශ්‍ය භාණ්ඩ මත ප්‍රදානය කරනු ලැබූ තීරු බදු අත්හැරීම් නිසා අහිමි වූ ආදායම රු.මිලියන 4,085 ක් විය.

**ආනයන බදු වෙනස්කම්**

**බදු පදනම පුළුල් කිරීම**

- ලෝක රේගු සංවිධානයේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි, පැවැති සංයෝජිත වර්ගීකරණ අංක සංශෝධනය කරනු ලැබූ අතර, නොපැහැදිලිතාවයන් නිරවුල් කිරීම සඳහා මෝටර් වාහන පරිච්ඡේදයට සංශෝධන ඇතුලත් කළ අතර එමගින් පැවති අඩුලුහුඩුකම් ඉවත් කරනු ලැබීය.

**අනුපාත වෙනස්කම්**

- පහත සඳහන් අයිතමයන් මත නිශ්චිත බදු පැනවීය.
  - . ටයර් - කි.ග්‍රෑ1 කට රු. 80/-
  - . චොක්ලට් - කි.ග්‍රෑ1 කට රු. 60/-
  - . අනෙකුත් රසකැවිලි - කි.ග්‍රෑ1 කට රු. 40/-
  - . ලූණු - කි.ග්‍රෑ1 කට රු. 5/-

**පරිපාලනමය ක්‍රියාමාර්ග**

- රේගු සංනිරීක්ෂණ යාන්ත්‍රණය වැඩිදියුණු කරමින් අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නගන ලදි.

**නිදහස් කිරීම්/ අනෙකුත් සංවර්ධන ක්‍රියාමාර්ග**

- ඉහළ යන ජීවන වියදම පාලනය කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ මත තීරුබදු අත්හැරීම් ප්‍රදානය කරන ලදි.

1.5 වගුව

**ප්‍රදානය කරන ලද තීරු බදු අත්හැරීම්**

| **අයිතම** | **අදාල තීරු බද්ද** | **අත්හැරීම** |
|---|---|---|
| අල | කි.ග්‍රෑ1 කට රු. 20/- | කි.ග්‍රෑ1 කට රු. 5/- |
| කරවල | 6 % | සම්පූර්ණ |
| හාල්මැස්සන් | 6 % | සම්පූර්ණ |
| උම්බලකඩ | 6 % | සම්පූර්ණ |
| ටින් මාලු | 15 % | සම්පූර්ණ |
| බීළුණු | කි.ග්‍රෑ1 කට රු. 20/- | සම්පූර්ණ |
| රතු ළූණු | කි.ග්‍රෑ1 කට රු. 5/- | සම්පූර්ණ* |
| සීනි | කි.ග්‍රෑ1 කට රු. 10/- | කි.ග්‍රෑ1 කට රු. 5/- |
| පරිප්පු | 3 % | සම්පූර්ණ |
| වියළි මිරිස් | කි.ග්‍රෑ1 කට රු. 30/- | සම්පූර්ණ |
| කව්පි | කි.ග්‍රෑ1 කට රු. 5/- | සම්පූර්ණ* |
| කඩල | 15 % | සම්පූර්ණ |
| මුං ඇට | කි.ග්‍රෑ1 කට රු. 5/- | සම්පූර්ණ |
| තිරිඟු පිටි | 15 % හෝ කි.ග්‍රෑ1 කට රු. 12.50 | කි.ග්‍රෑ1 කට රු. 5/* |
| කිරිපිටි | 15 % | 6 % |

මූලාශ්‍රය: වෙළඳ තීරු බදු ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

* ජනවාරි 31 දක්වා

- අදාල කර්මාන්තයන්ට උත්ප්‍රේරණයක් ලබා දීම සඳහා වතු වගා අංශයේ කර්මාන්ත ශාලා නවීකරණ සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහ කුකුළු ගොවිපල සහ චිත්‍රපට කර්මාන්ත සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර ආනයනය ආවරණය කිරීමට මෙතෙක් ලබා දෙන ලද තීරු බදු අත්හැරීම් තවදුරටත් පුළුල් කරනු ලැබීය.

- ආර්ථිකයේ සමස්ථ නිෂ්පාදනයට ඉහළ වටිනාකමක් එකතු කරන ඉහළ විභවතාවයකින් යුත් කර්මාන්තයන් හි අභිවෘද්ධිය උදෙසා සම් භාණ්ඩ හා පශු සම්පත් කර්මාන්තයන් හි යොදා ගන්නා අමුද්‍රව්‍ය තීරු බද්දෙන් නිදහස් කෙරිණි.

- ධාවනය කරන ලද බස් රථ ප්‍රමාණය වැඩි කිරීමට සහ මගීන්ට වඩා හොඳ සේවයක් ලබාදීමට බස් හිමියන් දිරිමත් කිරීම සඳහා පවතින බස් රථයක් වෙනුවට නව බස් රථයක් ආනයනය කිරීම තිරු බද්දෙන් නිදහස් කරනු ලැබීය.

**අනෙකුත් බදු**

- 2007 වසරේ ජනවාරි සිට මැයි කාලය තුලදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම රු.මිලියන 9,850 ක් වූ අතර එය, 2006 අදාල කාලපරිච්ඡේදයේ දී රු.මිලියන 7,508 ට සාපේක්ෂව සියයට 31 වර්ධනයක් වේ.

- 2006 ජුලි මස සිට ක්‍රියාත්මක වන මුද්දර බද්ද මගින් 2007 වසරේ මුල් මාස පහ තුල දී රු.මිලියන 1,469 ක ආදායමක් එක් රැස් කෙරිණි.

- අත්‍යවශ්‍ය නොවන ආනයනික භාණ්ඩ මත පනවා ඇති සෙස් බද්ද රු.මිලියන 5,180 ක් ලබාදුනි.
- මූලික වශයෙන් ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වලට සහාය දීමට පනවනු ලැබූ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද රු.මිලියන 593 ක් 2007 පළමු මාස පහ ඇතුලත ලබාදුනි.

**අනෙකුත් බදු වෙනස් කම්**

**අනුපාත වෙනස්කම්**

- ප්‍රති අපනයන සඳහා වන ආනයන හැර අනෙකුත් අයිතම මත වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු අනුපාතය සියයට 2.5 සිට සියයට 3 දක්වා වැඩි කෙරුණි.

- හඳුනාගත් අත්‍යවශ්‍ය නොවන ආනයන මත සෙස් බද්ද පැනවූ / ඉහළ නැංවූ අතර සපත්තු සඳහා යොදා ගන්නා කොටස් මත පැනවූ සෙස් බද්ද ඉවත් කෙරිණි.

**බදු පදනම පුළුල් කිරීම**

- 2006 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි සෙස් බද්ද අයකිරීමේ දී මිළ, රක්ෂණය හා ගැල්කුලී වටිනාකම **(CIF)** මත සියයට 10 ක ආන්තික ලාභයක් හඳුන්වා දෙනු ලැබිණි.

**නිදහස් කිරීම් / අනෙකුත් සංවර්ධන ක්‍රියාමාර්ග**

- ඇඟලුම් සහ රෙදිපිළි කර්මාන්තයේ යොදා ගන්නා යන්ත්‍රසූත්‍ර ආනයනය මත වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බද්ද සියයට 2 දක්වා පහත දැමිණි.

- අසාධ්‍ය ලෙඩ රෝග සඳහා යොදා ගන්නා ඇතැම් වෛද්‍ය ඖෂධ මත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කෙරිණි.

- නිශ්චිත ව හඳුනා ගත් මැණික් වර්ග, දියමන්ති සහ රත්තරන් ආනයන මත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කරනු ලැබීය.

- පිදුරු සහ ඒ සමාන ද්‍රව්‍ය භාවිතා කොට දේශීයව පුවරු නිෂ්පාදනය කිරීමට සහය වීම සඳහා සෙස් බදු අනුපාතය ඉහළ නැංවූ අතර දේශීය නිෂ්පාදකයින්ට සහය වනු පිණිස ආනයනික ඉස්සන්, සැකසු සහ සකස් නොකරන ලද නොලැබූ මාංශ නිෂ්පාදන හා ස්වර්ණාභරණ මත සෙස් බද්දක් පනවනු ලැබීය.

**බදු නොවන ආදායම ඇස්තමේන්තුගත අගයන් තුල**

- බදු නොවන ආදායම රු. මිලියන 22,950 ක් වන අතර, එය පසුගිය වසරේ පළමු මාස පහ හා සැසඳීමේදී එය සියයට 21 ක වර්ධනයක් පෙන්නුම් කරයි. රාජ්‍ය බැංකු, ශ්‍රී ලංකා ටෙලිකොම්, වරාය අධිකාරිය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතන වල ලාභ හා ලාභාංශ සහ ගාස්තු හා අනෙකුත් අයකිරීම්, මෙම කාල සීමාව තුළ බදු නොවන ආදායම වැඩි වීමට හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් රු. මිලියන 3,000ක් විය.

## 1.1 සටහන

**කාර්යය සමාලෝචනය - රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් - 2007**

**ආනයන ගාස්තු**

2007.02.02 - අ.සං. ආ. 1 / 2007 - පෙට්‍රල් සඳහා රේගු ගාස්තු රු. 5 සිට රු. 20 දක්වා ඉහළ නැංවීම. – *2007.02.01 අංක 1482/28 දරණ ගැසට් පත්‍රය*

2007.05.15 - අ.සං. ආ. 2 / 2007 -දකුණු ආසියා නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA) සහ 2007 කාණ්ඩය (සංයෝජිත වර්ගීකරණ සංකේත පද්ධතිය) සහ වෙළෙඳ තීරු බදු පරිෂද යෝජනා - *2007.05.14 අංක 1497/5 ගැසට් පත්‍රය*

2007.01.29 - රේගු ආඥා පනත - ප්‍රතිදාන අනුපාත අනුමත කිරීම *2007.01.29 අංක* 1482/4 *දරණ ගැසට් පත්‍රය*

**නිෂ්පාදන බදු / සුරා බදු**

2007.01.01 - අංක 892- දරණ සුරා බදු නිවේදනය *-2006.12.29 අංක 1477/25 දරණ ගැසට් පත්‍රය*

2007.03.13 - අංක 893, 894, 895, 896*දරණ සුරාබදු නිවේදන - මත්පැන් සඳහා බදු අනුපාත ඉහළ නැංවීම -2007.03.12 අංක 1488/1 දරණ ගැසට් පත්‍රය*

2007.04.11 - 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන ) පනතේ 3 වගන්තිය - යම් රජයේ නිලධාරියකු විසින් ආනයනය කරනු ලබන වාහන සඳහා සහනදායි ගාස්තු මත බදු පැනවීම *-2007.04.11 අංක 1492/8 දරණ ගැසට් පත්‍රය*

2007.04.11 - නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන ) පනතේ 3 ඇ වගන්තිය *2007.04.11අංක 1492/9 දරණ ගැසට් පත්‍රය*

- ➢ නිෂ්පාදන බදුවලින් නිදහස් මෝටර් රථ ප්‍රකාශයට පත් කිරීම

2007.05.15 - 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන ) පනත - *2007.05.14 අංක 1497/1 දරණ ගැසට් පත්‍රය*

- ➢ *බදු රැස් කිරීමේ පද්ධතිය සරල කිරීම සඳහා 87 වන පරිච්ඡේදය සංශෝධනය කිරීම*

*2007.06.07* -1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන ) පනතේ 3 වගන්තිය යටතේ වන නියෝග 1500/2*1 දරණ ගැසට් පත්‍රය*

- ➢ *සිගරට් සඳහා වන බදු අනුපාත සංශෝධනය කිරීම*

**සෙස්**

2006.11.17 - 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය

- ➢ ආනයනික පාවහන් කොටස් සහ බී ළුණු සඳහා සෙස් බද්ද ඉවත් කිරීම - 2006.12.29*අංක 1477/*16 *දරණ ගැසට් පත්‍රය*

2007.05.15 - 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තිය

- ➢ *බදු රැස් කිරීමේ පද්ධතිය සරල කිරීම සඳහා 87 වන පරිච්ඡේදය සංශෝධනය කිරීම -2007.05.14 අංක* 1497/2 *දරණ ගැසට් පත්‍රය*

<u>කාර්යය සමාලෝචනය - රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් - 2007</u>

**එකතු කළ අගය මත බදු**

2007.06.05 - 2005 අංක 6 දරණ එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 2 (අ) වගන්තිය *-2007.06.06 අංක* 1500/20 *දරණ ගැසට් පත්‍රය*

- *සැමන්,කඩල සහ මුං ඇට සඳහා* එකතු කළ අගය මත බදු අනුපාතය 15% සිට 5% දක්වා අඩු කිරීම

**අනෙකුත් බදු ක්‍රියාකාරකම්**

2007.05.14 - 2002 අංක 11 දරණ මුදල් පනත යටතේ නම් කරන ලද ආනයනික අයිතම වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් නිදහස් කිරීම - *2007.01.01 අංක* 1478/3 *දරණ ගැසට් පත්‍රය, 2007.05.14අංක* 1497/3 *දරණ ගැසට් පත්‍රය*

2007.01.16 - 2006 අංක 11 දරණ මුදල් පනතේ 2 (1) (ආ) (1) සහ (11) වගන්තිය *-2007.05.14අංක* 1497/4 *දරණ ගැසට් පත්‍රය* (යහපත් බදු වෙන්නන් සඳහා මෝටර් වාහන අනුග්‍රාහකත්වය )

2007.01.01 - 2002 අංක 16 දරණ හර බදු පනතෙහි 13 වන වගන්තිය යටතේ සමෘද්ධි අධිකාරිය සඳහා හර බදු නිදහස් කිරීම - *2007.01.02 අංක* 1478/10 *දරණ ගැසට් පත්‍රය*

2007.06.20 - 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වන වගන්තිය යටතේ වන නියෝග - *2007.06.20 අංක* 1502/10*දරණ ගැසට් පත්‍රය*

2007.01.01 - 2006 අංක 12 දරණ මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත

- 5 වන වගන්තිය යටතේ නිදහස් කිරීම් ලබා දීම 2007.01.01 *අංක* 1478/7 *දරණ ගැසට් පත්‍රය*

**අනෙකුත් ක්‍රියාකාරකම්**

2007.01.01 - 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනත

- 7 වන වගන්තිය යටතේ උතුරු හා නැගෙනහිර *පලාත් සඳහා මත්පැන් හා සිගරට් මත ව්‍යාපාර පිරිවැටුම් බදු අනුපාත ඉහළ නැංවීම- 2007.01.01 අංක* 1478/8 *දරණ ගැසට් පත්‍රය*

2007.01.05 - පෙට්‍රල් මිළ රු. .5/- කින් ඉහළ නැංවීම

2007.03.30 - පෙට්‍රල් මිළ රු. .7/- කින් ඉහළ නැංවීම

2007.04.18 - ඩීසල් මිළ රු. 3/-, භූමිතෙල් .2/-, ලිහිසි තෙල් රු.3/- ඉහළ නැංවීම

2007.04.27 - පෙට්‍රල් මිළ රු. .1/-, ඩීසල් මිළ රු...2/- ඉහළ නැංවීම

2007.05.09 - පෙට්‍රල් මිළ රු. .1/-, ඩීසල් මිළ රු.2/- ඉහළ නැංවීම

2007.05.16 - ගෑස් මිළ ඉහළ නැංවීම- ෂෙල් ගෑස් රු. .38/-, ලාෆ් ගෑස් රු.20/-

# 1.2 සටහන

**මූල්‍ය සහ ආදායම සම්බන්ධ ව්‍යවස්ථා (2006 නොවැම්බර් - 2007 ජූනි)**

| ව්‍යවස්ථාව | අරමුණ |
|---|---|
| 2006 අංක 46 දරණ බැංකු (සංශෝධන)පනත | විශේෂිත බැංකුවක සිට වෙනත් බැංකුවකට වත්කම් සහ / හෝ වගකීම් මාරු කිරීමට බැංකු පනත මගින් ඉඩ සලසා නැති නිසා අසාර්ථක බැංකුකරුවන්හට අසාර්ථක බැංකුවක සිට රාජ්‍ය බැංකුවකට වත්කම් /වගකීම් මාරු කිරීමට ප්‍රතිපාදන සැකසීමට හැකි වන සේ අදාළ වන සංශෝධන ඇතුලත් කර මෙම පනත සාදා ඇත |
| 2006 අංක 48 දරණ මුදල් (සංශෝධන) පනත | ජාතික ආර්ථිකය සඳහා වැදගත්කමක් ඇති ලෙස සලකන ද්‍රව්‍ය වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීම සහ සහනදායි බදු අනුපාත යටතේ ලබාදීම සඳහා වරාය හා ගුවනතොටුපල සංවර්ධන බදු අනුපාත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි. |
| 2006 අංක 49 දරණ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකම අඩුවෙන් දැක්වීම නිසා අහිමි වන රජයේ ආදායම අවම කිරීමේ අරමුණින් රේගුවේදී මිළ, රක්ෂණ හා ගැල්කුලී වටිනාකම මත අයකරන එකතු කළ අගය මත බදු හා සම්බන්ධ ආන්තික ලාභය වැඩි කර ගැනීමට ප්‍රතිපාදන සැලැස්වීම සඳහා වූ පනතකි. |
| 2006 අංක 50 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත | ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකම අඩුවෙන් දැක්වීම නිසා අහිමි වන රජයේ ආදායම අවම කිරීමේ අරමුණින් රේගුවේදී මිළ, රක්ෂණ හා ගැල්කුලී වටිනාකම මත අයකරන නිෂ්පාදන බදු හා සම්බන්ධ ආන්තික ලාභය වැඩි කර ගැනීමට ප්‍රතිපාදන සැලැස්වීම සඳහා වූ පනතකි |
| 2006 අංක 51 දරණ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත | නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් මොටර් රථ සඳහා බද්දක් පැනවීමට ප්‍රතිපාදන සැලැස්වීම සඳහා වූ පනතකි |
| 2007අංක 14දරණ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | ඇතැම් අයිතමවල යෙදවුම් බදු බැර සඳහා එකතු කළ අගය මත බදු රඳවා ගැනීම් ප්‍රතිපාදන සංශෝධන, බදු අනුපාතය 5% දක්වා අඩු කිරීම, බදු නිදහස් කිරීම් හඳුන්වාදීම සඳහා 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සංශෝධනය මගින් හඳුන්වා දුන් පනතකි |
| 2007 අංක 10 දරණ දේශීය ආදායම් පනත | ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය ව්‍යාපාර රක්ෂණ වෙන් වෙන්ව සැලකීම, ඒකක භාර කොටස් අලෙවියෙන් ලැබෙන ආදායම බද්දෙන් නිදහස් කිරීම, හවුල් ව්‍යාපාර සඳහා රුපියල් 600,000 යේ බදු මිළ හා පිරිවැටුම් සීමාවන් වැනි දෑ සඳහා 2007 අයවැය කථාව මගින් ඉදිරිපත් කළ යෝජනා සඳහා නීතිමය විධිවිධාන සැලසීම සඳහා 2006 අංක 10 දරණ ආදායම් බදු පනත සංශෝධනය මගින් හඳුන්වා දුන් පනතකි |
| 2007 අංක 15 දරණ ආර්ථික සේවා ගාස්තු පනත | ආර්ථික සේවා ගාස්තුව සඳහා වූ පිරිවැටුම සංශෝධනය කිරීම, නිෂ්පාදන ආයතන සඳහා වසර 3 ක ආර්ථික සේවා ගාස්තු බදු සහනයක් ලබා දීම, ඇතැම් ව්‍යාපාර සඳහා ආර්ථික සේවා ගාස්තු අනුපාත අඩු කිරීම සඳහා වූ සංශෝධන ඇතුලත් පනතකි |
| 2007 අංක 13 දරණ මුදල් පනත | 2006 අංක 11 දරණ මුදල් පනත ( මොටර් වාහන අනුග්‍රාහක බද්ද පැනවීම), 2005 අංක 5 දරණ මුදල් පනත ( ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද) , 2002 අංක 11 දරණ මුදල් පනත සංශෝධනය සඳහා වූ පනතකි |
| 2007 අංක 12 දරණ භර බදු (සංශෝධන) පනත | ක්‍රියාකාරිත්වයේ සමතුලිත මට්ටමක් ඇති කිරීම සඳහා මූල්‍ය සමාගම් මගින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුම් සහ විශේෂිත බැංකු මගින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් ඇතුලත් කිරීම සඳහා ඇතිකල පනතකි. එමෙන්ම “භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම” හර බද්දෙන් නිදහස් කිරීම |

**රාජ්‍ය වියදම් තාර්කික කිරීමේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා**

- රටේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ත්‍රස්තවාදී ගැටුම් බලපානු ලැබූ ප්‍රදේශද විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ මෑතකදී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදාගත් ප්‍රදේශ ද ආවරණය වන පරිදි "ජාතික සවිය - ගම නැගුම", "මග නැගුම" සහ අනෙකුත් දිළිඳුකම පිටුදැකීමේ සංවර්ධන වැඩසටහන් ආදි නව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක විය.

- රාජ්‍ය අංශයේ සේවා යාන්ත්‍රණයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය තුලනය ලබාදෙන අතරෙහි ම සේවක සංඛ්‍යා කළමනාකරණය සහ නව බඳවා ගැනීමේ මාර්ගෝපදේශයන්, අයවැය වෙන්කිරීම් ඇතුළත ක්‍රියාවට නංවනු ලැබීය.

- රාජ්‍ය අංශයේ පහළ වැටුප් ලබන්නන් සඳහා ණය පොළී පිරිවැය වෙනස් නොවන අයුරින් පවත්වා ගනිමින් ණය පොළී අනුපාත සංශෝධනය කරමින් රජයේ සියළු නිවාස ණය සම්බන්ධයෙන් නව චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ලැබීය.

- ඉන්ධන සහනාධාර ඉවත් කිරීමත් සමග සමෘද්ධි ප්‍රතිලාභීන්, ධීවරයින් සහ ත්‍රීරෝධ රථ හිමියන් වැනි පීඩාවට පත්විය හැකි කොටස් මත එහි බර අවම කිරීම සඳහා සහනාධාර වැඩසටහනක් සකස් කරමින් පවතී. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන මිළ කාලාවර්තිකව සංශෝධනය කළ ද ඛණිජ තෙල් නිෂ්පාදිත පිරිවැය මිළට වඩා අඩු මිළකට අලෙවි කරමින් සිටී. දැනට සකස් කරමින් පවතින සහනාධාර වැඩසටහන ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ වර්තමාන අලාභයන් අවම කරන අතරෙහි සමාජයේ දුප්පත්ම කොටස් සඳහා ආරක්ෂිත ජාලයක් නිර්මාණය කිරීම සහතික කරනු ඇත.

- දේශීය හා විදේශීය ණය අතර යෝග්‍ය මිශ්‍රණයක් තෝරා ගැනීම හරහා අඩු පිරිවැය ණය ගැනීම් උපකරණ යොදා ගැනීම තුළින් රජයේ ණය ගැනීමේ වැඩසටහන කළමනාකරණය කෙරිණි. භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයන්ට ආයෝජනය කිරීමට අවස්ථාව ලබාදීමේ තීරණයන්හි ප්‍රතිලාභ ලැබී ඇති අතර, 2007 මැයි මස අවසන් වන විට ඇ. ඩො. මිලියන 460 ක් භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයින් ආයෝජනය කරනු ලැබූ අතර එය දේශීය වෙළෙඳපල ණය ගැනීම් මත පීඩනය අඩු කිරීමට ඉවහල් විය.
- භාණ්ඩාගාරය හා අමාත්‍යාංශ අතර අරමුදල් පැවරීමේ වර්තමාන ක්‍රමයේ ඇති දුර්වලතා ඉවත් කිරීම සඳහා භාණ්ඩාගාර කේවල ගිණුමක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. රජය ගෙවිය යුතු පොළිය මත සැලකිය යුතු ඉතිරි කිරීමක් ඇති කරමින් දෛනික ශේෂයන් පදනම් කරගෙන රජයේ බැංකු ගිණුම්හි භාවිතයට නොගත් මුදල් ශේෂයන් මෙමගින් සුරක්ෂිත කෙරේ. මෙමගින් දෛනික පදනමකින් භාණ්ඩාගාර අයිරා ශේෂයන් අඩු කිරීමට පද්ධතිය තුළ ඇති භාවිතයට නොගත් මුදල් ශේෂයන් යොදා ගැනීමට හැකියාව ලැබේ.

## රාජ්‍ය වියදම්

- 2007 වර්ෂයේ පළමු මාස පහ සඳහා රජයේ සම්පූර්ණ වියදම රු.මිලියන 318,023 ක්වූ අතර, එයින් රු. මිලියන 247,623 ක් පුනරාවර්තන වියදම් වූ අතර, රු. මිලියන 70,400 ප්‍රාග්ධන වියදම් විය. මෙම කාලය තුල රජයේ වියදමෙහි සැළකිය යුතු ලක්ෂණය වූයේ, වැටුප්, විශ්‍රාම වැටුප්, පොලී ගෙවීම් සහ ආරක්ෂාව සම්බන්ධ වියදම් යන අංශවල පුනරාවර්තන වියදම් වැඩිවීම නිසා අයවැය මත අතිරේක පීඩනයක් ඇතිකර තිබියදීත්, මාර්ග සංවර්ධනය, ජලය සහ සනීපාරක්ෂාව, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ පළාත් සංවර්ධන කටයුතු වැනි කේෂ්ත්‍රයන්හි සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීමේ වගකීම දේශීය අරමුදල් හා විදේශීය ආධාර යෙදවීම මගින් අඛණ්ඩව සිදුකිරීමයි.

වගුව **1.6**

**රාජ්‍ය වියදම් කාර්ය සාධනය (ජන. - මැයි)**

(රු.මිලියන)

| | **2006** | **2007** |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **222,614** | **247,623** |
| වැටුප් හා වේතන | 65,998 | 85,496 |
| පොළිය | 62,036 | 71,300 |
| සමෘද්ධි | 3,844 | 3,850 |
| පොහොර සහනාධාර | 6,374 | 6,600 |
| විශ්‍රාම වැටුප් | 22,752 | 27,131 |
| වෙනත් වියදම් | 61,610 | 53,246 |
| **ප්‍රාග්ධන වියදම්** | **60,157** | **70,399** |
| විශාල යටිතල පහසුකම් | 23,402 | 30,800 |
| පළාත් සභා | 3,129 | 4,365 |
| කුඩා යටිතල පහසුකම් සහ අනෙකුත් | 33,626 | 35,234 |

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**වැටුප් හා විශ්‍රාම වැටුප්**

- රජයේ සේවකයන්ගේ වැටුප් සඳහා වියදම රු. මිලියන 85,496 දක්වා වැඩි වූ අතර පසුගිය වසරේ එම කාලය හා සැසඳීමේදී එය සියයට 30 ක වැඩිවීමකි. වඩා හොඳ රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා ජීවන වියදම් දීමනාව ලබා දීම, නව බඳවා ගැනීම් සහ පුරප්පාඩු පිරවීම තවදුරටත් වැටුප් වැඩි වීමට හේතු වී ඇත. තවද ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවා ගත් ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ බඳවා ගැනීම් ද වැටුප් සඳහා වියදම වැඩිවීමට හේතු වී ඇත.

- විශ්‍රාම වැටුප් වැඩිවීම සහ අයවැයෙන් නිවේදනය කළ පරිදි ජීවන වියදම් දීමනාව ගෙවීම සහ පසුගිය වසරේ වැඩි වූ පරිමාණයන්ට අනුව 18,000 ක් පමණ විශ්‍රාමිකයන් ලෙස ලියාපදිංචි වීමේ සම්පූර්ණ බලපෑම පිළිබිඹු කරමින් විශ්‍රාම වැටුප් ගෙවීම් වියදම සියයට 19 කින් වර්ධනය වී රු. මිලියන 27,131 ක් දක්වා වැඩිවී ඇත.

**ණය සේවාකරණ ගෙවීම් සඳහා දැඩි පීඩනයක්**

- ශ්‍රී ලංකා මහ බැංකු මගින් ප්‍රතිපත්ති අනුපාත වැඩි කිරීම සඳහා කරන ලද ගැලපීම් හා කෙටිකාලීන කල්පිරීමක් සහිත ණය සාධන පත්‍රවල ආයෝජනය කිරීම වැඩිවීමේ ප්‍රවණතාවය අනුව රජයේ සුරැකුම්පත්වල දේශීය පොළී අනුපාත ඉහළ යාම දේශීය හා විදේශීය ණය සඳහා පොළී ගෙවීම් සියයට 15 කින් ඉහල යමින් රු. මිලියන 71,300 ක් දක්වා වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. පොළී ගෙවීම් සඳහා වියදම වැඩිවීමට විදේශීය විනිමය අනුපාත අවප්‍රමාණය වීම ද හේතු වී ඇත. පොළී අනුපාත ඉහළයෑම පාලනය කිරීම සඳහා රාජ්‍ය ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම, මනා ණය කළමනාකරණ ක්‍රමවේදයක් සහ විකල්ප මූල්‍ය ක්‍රියාමාර්ගයක් ඇති කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් වී ඇත.

## 1.7 වගුව

## එළදා අනුපාතිකයේ හැසිරීම (%) - 2007

| වර්ෂය | භාණ්ඩාගාර බිල්පත් | | | භාණ්ඩාගාර බැඳුම්කර | | | |
|---|---|---|---|---|---|---|---|
| | දින **91** | දින **182** | දින **364** | වසර **2** | වසර **3** | වසර **4** | වසර **5** |
| 2006 මැයි | 10.09 | 10.36 | 10.38 | - | 10.9 | 10.92 | 10.95 |
| 2007 ජන. | 12.84 | 12.96 | 13.05 | - | 12.35 | - | 12.36 |
| 2007 පෙබ. | 13.61 | 13.81 | 14.16 | 13.35 | 13.1 | 13.81 | 13.35 |
| 2007 මාර්. | 14.34 | 14.43 | 14.41 | 14.07 | 14.1 | 14.13 | 13.68 |
| 2007 අප්‍රේ. | 15.34 | 15.15 | 14.49 | - | 14.2 | - | 13.67 |
| 2007 මැයි | 16.59 | 16.34 | 16.21 | - | 14.24 | - | 13.67 |
| වෙනස | **6.5** | **5.98** | **5.83** | **-** | **3.34** | **-** | **2.72** |

*මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**පීඩාවට පත්විය හැකි කණ්ඩායම් සඳහා සුබසාධන වියදම් සඳහා සමාජ ආරක්ෂණ කටයුතු අඛණ්ඩව**

- පීඩාවට පත්විය හැකි කණ්ඩායම් සඳහා ආදායම් ඉපදවීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කරන අතර ම ඔවුන් සඳහා වූ සමාජ ආරක්ෂණ කටයුතු මගින් එම කණ්ඩායම් සඳහා සහාය වීමට දිළිඳුකම පිටුදැකීමේ ක්‍රියාමාර්ගය තුළින්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ කටයුතු 2007 වසරේදී අඛණ්ඩව පවත්වා ගනු ලැබිණි.

- පෝෂ්‍යදායී ආහාර මල්ලක් සැපයීම, නොමිළේ පෙළ පොත්, වාර ප්‍රවේශ පත්, ශිෂ්‍යාධාර, ආබාධිත සෙබළුන්ට ආධාර සැපයීම, අනෙකුත් සුබසාධන වැඩසටහන් ඉහළ පිරිවැයකින් යුතුව අඛණ්ඩව පවත්වා ගත් අතර, සමෘද්ධි සහනාධාර සඳහා වියදම රු. මිලියන 3,850 දක්වා වැඩිවී ඇත.

**1.8 වගුව**

**සුභසාධන ගෙවීම් හා සහනාධාර - ( ජන - මැයි)**

**(රු. මිලියන)**

| අයිතමය | 2006 | 2007 |
|---|---:|---:|
| **දරුවන්** | | |
| ළදරු කිරිපිටි සහනාධාරය | 30 | 32 |
| පෝෂණ මල්ල | 30 | 33 |
| ත්‍රිපෝෂ වැඩ සටහන | 102 | 115 |
| නොමිලයේ පෙළපොත් හා නිල ඇඳුම් | 495 | 575 |
| පාසල් වාර ප්‍රවේශ පත්‍ර | 150 | 190 |
| දහම් පාසල් පෙළපොත් හා නිල ඇඳුම් | 30 | 34 |
| පාසල් පෝෂණ ආහාර | 350 | 389 |
| **කෘෂිකර්මාන්තය** | | |
| කෘෂි ණය පොළිය සඳහා සහනාධාර ආදිය | 30 | 35 |
| පොහොර සහනාධාරය | 6,374 | 6,600 |
| **සුභසාධන ගෙවීම්** | | |
| සමෘද්ධි සහනාධාරය | 3,844 | 3,850 |
| ආබාධිත රණවිරුවන් සඳහා ආධාර | 2,031 | 3,400 |
| ලෝක ආහාර වැඩසටහන යටතේ ආධාර | 500 | 520 |
| ගංවතුර හා නියං සහනාධාර | 75 | 57 |

**මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

- අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා වූ ප්‍රජා මූලික ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් වන "ජාතික සවිය - ගම නැගුම" වැඩසටහන 2007 වසරේදී තවදුරටත් ශක්තිමත් කෙරිණි. 2007 වසරේ මැයි මස වන විට මෙම වැඩසටහන සඳහා වූ වියදම රු. මිලියන 1,890 ක් විය.

**1.9** වගුව

ගම නැගුම - ජාතික සවිය වැඩසටහනේ ප්‍රගතිය - 2007 මැයි වන විට

| දිස්ත්‍රික්කය | ප්‍රා.ස./ නගර සභා | ග්‍රා.නි. කොට්ඨාශ | ව්‍යාපෘති ගණන | ප්‍රතිපාදන රු. මිලියන |
|---|---|---|---|---|
| කොළඹ | 8 | 144 | 135 | 32.10 |
| ගම්පහ | 13 | 266 | 234 | 118.40 |
| කළුතර | 14 | 242 | 238 | 60.20 |
| ගාල්ල | 19 | 268 | 262 | 125.00 |
| මාතර | 15 | 216 | 210 | 108.60 |
| හම්බන්තොට | 11 | 144 | 128 | 101.50 |
| මහනුවර | 19 | 279 | 294 | 146.10 |
| මාතලේ | 11 | 146 | 146 | 74.00 |
| නුවර එළිය | 6 | 144 | 142 | 84.80 |
| අනුරාධපුර | 19 | 256 | 252 | 128.00 |
| පොළොන්නරුව | 7 | 114 | 108 | 50.60 |
| කෑගල්ල | 11 | 223 | 217 | 96.70 |
| රත්නපුර | 16 | 268 | 265 | 131.50 |
| පුත්තලම | 12 | 207 | 198 | 96.30 |
| කුරුණෑගල | 18 | 347 | 341 | 170.50 |
| අම්පාර | 16 | 189 | 143 | 71.40 |
| ත්‍රිකුණාමලය | 11 | 103 | 100 | 51.10 |
| මඩකළපුව | 3 | 50 | 17 | 70.00 |
| බදුල්ල | 17 | 216 | 216 | 112.40 |
| මොනරාගල | 11 | 124 | 124 | 60.90 |
| **මුළු එකතුව** | **257** | **3,946** | **3,800** | **1,890.10** |

මූලාශ්‍රය: ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය

- ග්‍රාමීය යටිතල පහසුකම් නංවාලීම සඳහා සැළසුම් කළ "මග නැගුම" වැඩසටහනෙහි 2007 වසරේ මැයි මස අවසන් වන විට වියදම රු. මිලියන 700 ක් වූ අතර කි. මී. 200 ක් පමණ වූ ග්‍රාමීය මාර්ග මෙම වැඩසටහන යටතේ වැඩිදියුණු කෙරිණි.

**කෘෂිකර්මාන්තය සඳහා වන ආධාර වැඩි කිරීම.**

- අඩු ආදායම් ලබන කුඩා ඉඩම් හිමි ගොවීන් ඉලක්ක කර ගනිමින් පොහොර සහනාධාරය තවදුරටත්ක්‍රියාත්මක කෙරුනු අතර, ඒ සඳහා 2007 මැයි මස වන විට රු. මිලියන 6,600 ක් වැය කර තිබිණ.

- වී මිලදී ගැනීම සඳහා දිසාපතිවරුන්ට චක්‍රීය අරමුදල මගින් සලසා දෙනු ලැබූ අත්තිකාරම් මුදල 2007 මැයි මස අවසාන විට රු.මිලියන 1,600 කි. වී මිලදී ගැනීම සඳහා චක්‍රීය අරමුදල මගින් කලින් ලබා දී තිබූ අත්තිකාරම් පියවීම හේතුවෙන් මෙම ක්‍රියාවලිය මගින් රාජ්‍ය අයවැය කෙරෙහි වූ බලපෑම් ලිහිල් කිරීමට හේතු විය.

- කෘෂි අංශයට ලබාදුන් අනෙකුත් සහන අතර කෘෂි ණය, වී මෝල් නවීකරණ සඳහා ලබාදුන් ණය සහ කෘෂි බීජ සඳහා වෙන් කිරීම් 2007 මැයි වන විට රු.මිලියන 35 ක් විය.

- තිරිඟු පිටි හා තිරිඟු ඇට සඳහා ඉහල තීරු බදු අනුපාත පවත්වා ගෙන යමින් සහල් පරිභෝජනය සඳහා ජනතාව නැවත යොමු කරවනු ලැබිණ.

- සකස් කරන ලද කෘෂි නිෂ්පාදන මගින් ලබන ලාභ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරන ලද අතර එය කිරි, යෝගට් ආදී කිරි නිෂ්පාදන සඳහාද ව්‍යාප්ත කරන ලදී.

**මුදා ගන්නා ලද ප්‍රදේශයන්හි අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රවණතාවයන්**

- නැගෙනහිර පලාත තුල අභ්‍යන්තර අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම මෙම කාලය තුල සිදු විය. මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉරුවිල්, පොරයි තිරුපාරු, පට්ටිපොරු, වවුනතිව් සහ වාකරෙයි යන ප්‍රදේශයන් හි අභ්‍යන්තර අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම අවසන් කර ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරුගල් සහ ඉච්චැච්කයිල් පත්තු යන ප්‍රදේශයන් හි ජනතාව නැවත පදිංචි කරවීම සිදුවෙමින් පවතී. මේ වන විට මෙම ප්‍රදේශයන්හි පවුල් 130,000 ක් පමණ නැවත පදිංචි කරවීම සිදු කර ඇත.

- විදුලිය මංමාවත් ඉදිකිරීම වැනි මූලික අවශ්‍යතාවයන් සහ රාජ්‍ය පරිපාලන යාන්ත්‍රනය යළි ස්ථාපිත කිරීම සිදු කරමින් පවති. නැවත පදිංචිකරවීම සංවර්ධන කාර්යයන් හා මානුෂිය ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල රු.මිලියන 288 ක් පමණ විය.

.

**සංවර්ධන වැඩසහන් සඳහා වූ වියදම් ඉහළ යෑම**

**මානව සම්පත් සංවර්ධනය**

- 2006 වර්ෂයේ සමාලෝචන කාලය තුල වියදම් වූ රු.බිලියන 42 හා සසඳන කල 2007 මැයි මස වන විට සෞඛ්‍ය, නිපුණතා සංවර්ධනය හා අධ්‍යාපනය සඳහා වූ මුළු වියදම රු.බිලියන 48 කි.

- අප්‍රේල් අග භාගය වන විට සෞඛ්‍ය සැපයුම් සඳහා වියදම රු.මිලියන 1,572 කි.

- සෞඛ්‍ය සේවයේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා හෙදියන් 1,146 ක් වෛද්‍ය නිලධාරින් 732ක්, පවුල් සෞඛ්‍ය නිළධාරීන් 712 ක් සහ තාක්ෂණික ශ්‍රේණින් සඳහා 311 ක් ද වශයෙන් 2007 වර්ෂය තුලදි බඳවා ගනු ලැබිණි.

**මාර්ග**

- 2007 මැයි වන විට මාර්ග සංවර්ධනය සඳහා වූ ආයෝජන රු.බිලියන 12 ක් විය. අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රු.මිලියන 2,881 ක් ද, මහා මාර්ග සංවර්ධනය සඳහා රු.මිලියන 4,557 ක් ද, පාලම් සහ බෝක්කු ඉදිකිරීම සඳහා රු.මිලියන 542 ක්ද, සුනාමි ව්‍යසනයෙන් හානියට පත් මාර්ග සඳහා රු.මිලියන 911 ක් ද මෙයට ඇතුලත් වේ.

- අම්බලන්ගොඩ-ඇල්පිටිය (කි.මී.21) ගම්පොල-නුවරඑළිය (කි.මී.54) වැනි මහා පරිමාණ මාර්ග ව්‍යාපෘතීන් සහ ගාල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ගං වතුරෙන් හානියට පත් මාර්ග ව්‍යාපෘති තුනක් ද මෙම කාලය තුළදි නිම කරන ලදි.

**ජල සම්පාදනය**

- 2007 මුල් මාස 05 සඳහා ජල හා සනීපාරක්ෂක වියදම රු.මිලියන. 6,500 කි.
- 2007 වසර තුල විවිධ නාගරිකයන්හි මහා පරිමාණයේ ජල සම්පාදන යෝජනා ක්‍රම ආරම්භ කරනු ලැබිණ. නින්තාවූර්හි කි.මී.50 ක් දිග නල මාර්ගය සමගම, අම්පාර නගරයේ ස්ථාපිත කරනු ලැබූ දිනකට ජල ගැලුම් මිලියන 126 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණ, ගාල්ලේ ස්ථාපිත කළ කි.මී.180 ක දිගින් යුත් බෙදාහැරීම් නල මාර්ගය මෙම කාලය තුලදි සම්පූර්ණ කරන ලදි. මෙම වැඩසටහන යටතේ ජලාශයන් 06 ක වැඩ කටයුතු අවසන් කර ඇති අතර, දිනකට ජල ගැලුම් මිලියන 7 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් ඉදිකිරීම් කටයුතු පේරාදෙණියේ ආරම්භ කර ඇත.

- පොතුවිල්, කළුතර, මාතර. තංගල්ල, හම්බන්තොට, කිරින්ද, අම්බලන්තොට හා තිරුක්කෝවිල් ආදී සුනාමි ව්‍යසනයෙන් හානියට පත් වීමෙන් පසු නැවත පදිංචි කිරීම් සිදුකරන ලද ප්‍රදේශ වල ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි බෙදාහැරීම් පද්ධතිය පුළුල් කිරීමට හා වැඩිදියුණු කිරීම සඳහා වසරේ මුල් කාර්තුව තුල රු.මිලියන 337 ක් වැය කරන ලදි.

- ගම්පහ, රත්නපුර, අනුරාධපුර, මාතලේ හා බදුල්ල දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 240 ක ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදිකිරීම සඳහා වසරේ මුල් කාර්තුව තුල රු.මිලියන 450 ක් වැය කෙරිණි.

- පවුල් 70,000 කට ප්‍රතිලාභ සලසමින් මාතලේ, නුවර, නුවරඑළිය හා කුරුණෑගල දිස්ත්‍රික්කයන් හි ග්‍රාම නිලධාරි කොට්ඨාශ 282 ක් සඳහා ජලසම්පාදන යෝජනා ක්‍රම ස්ථාපිත කරන ලදි.

**භාණ්ඩාගාර මෙහෙයුම්**

**මූල්‍ය මෙහෙයුම්**

- 2007 මැයි අවසානය දක්වා අපේක්ෂිත ආදායමේ යම් අඩුවක් පැවතියද මෙහෙයුම් හා ආයෝජන කටයුතුවලින් පසුව ඇතිවූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. බිලියන 11.6 කි. 2007 වසරේ මුල් මාස 5 සඳහා ආයෝජන වලට පසුව ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 54.3 කි. ආරම්භක මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු හා සැසඳීමේදී ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහය රු. බිලියන 2.3 කින් වැඩි වී ඇත. ණය ආපසු ගෙවීම් ඇස්තමේන්තුගත අගය ඉක්මවූ අතර, රු. බිලියන 66 ක්වූ මුදල් හිඟය පියවීම සඳහා දළ ණය ගැනීම් වැඩි කරන ලදී.

- බැංකුවල භාවිතයට ගැණුනු අයිරා ශේෂය වසර ආරම්භයේදී රු. බිලියන 31.6 සිට 2007 වසරේ මැයි වන විට එම අගය රු. බිලියන 33.4 දක්වා වැඩි විය.

**1.10** වගුව

**රජයේ මුදල් ප්‍රවාහ මෙහෙයුම් ප්‍රකාශය - (ජනවාරි-මැයි)**

**(රු. මිලියන)**

| අයිතමය | **2006** තත්‍ය | **2007** ආරම්භක ඇස්ත. | **2007** තත්‍ය මුදල් ප්‍රවාහය |
|---|---|---|---|
| ආදායමෙන් මුළු මුදල් ගලා ඒම | 175,729 | 229,016 | 218,180 |
| මෙහෙයුම් කටයුතුවලින් මුළු මුදල් ගලා යාම | (211,454) | (232,714) | (229,802) |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (35,725) | (3,698) | (11,622) |
| ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය | (45,682) | (51,968) | (54,298) |
| ශුද්ධ මුදල් අතිරික්තය (හිඟය) | (81,407) | (55,666) | (65,920) |
| ආරම්භක මුදල් ශේෂය | (10,989) | (31,622) | (31,622) |
| දළ ණය ගැනීම් | 170,953 | 170,435 | 173,650 |
| ණය ගෙවීම් | (98,665) | (87,449) | (87,431) |
| ශුද්ධ ණය ගෙවීම් | 72,288 | 82,986 | 86,219 |
| ගිණුම් ශේෂ ගැලපිලි | 1,675 | 23,793 | 22,094 |
| අවසාන ශේෂ | (21,783) | (28,095) | (33,417) |

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

# 2 පරිච්ඡේදය

# ආර්ථිකය

## වර්ධන ප්‍රවනතා අඛණ්ඩව

- ඇතැම් ප්‍රධාන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය අඩු වුවත් 2007 වසරේ පළමු කාර්තුව තුල පැවති සියයට 6.1 ක ද.දේ.නි. වර්ධනයක් සමග, ශ්‍රී ලංකාවේ ආර්ථිකය අඛණ්ඩව සීඝ්‍ර වර්ධන ප්‍රවනතාවයක් පෙන්නුම් කර ඇත. පළමු කාර්තුව තුල කර්මාන්ත හා සේවා අංශය සියයට 7.0 කට වඩා වර්ධනය වී ඇත. 2007 වසරේ පළමු කාර්තුව තුල සහ 2006 වසරේ 4 වන කාර්තුව තුල පැවති අසතුටුදායක කාළගුණික තත්ත්වය හේතුවෙන් වී සහ සුළු අපනයන භෝග නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා වූ අතර පශු සම්පත්, තවදුරටත් උස් බිම් භෝග නිෂ්පාදනය, පලතුරු සහ එළවලු නිෂ්පාදනය යන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිෂ්පාදනය වර්ධනය වී ඇත. කෘෂිකාර්මික උප අංශ 2006 වර්ෂයේ පළමු කාර්තුව තුල පැවති වර්ධනය එලෙසම පවත්වාගෙන ඇත.

**2.1** රූප සටහන



- 2006 වසරේ පළමු කාර්තුව තුළ පැවති සියයට 4.1 ක වර්ධනය හා සැසඳීමේදී නිෂ්පාදන අංශයේ සියයට 5.4 ක වර්ධනයක් මෙම වසරේ පළමු කාර්තුව තුළ පෙන්නුම් කර ඇත. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවති දැඩි තරගකාරිත්වයකින් යුත් වාතාවරණය තුළ වුවද රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය පෙර පැවති තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ඇති අතර එය 2006 වසරේ අදාල කාලය තුළ පැවති සියයට 0.9 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේදී සියයට 5 කින් වර්ධනය වී ඇත. ඉදිකිරීම් කර්මාන්තය එහි සීඝ්‍ර වර්ධන ප්‍රවනතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් සියයට 9.5 ක ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කර ඇත.

- සේවා ආර්ථිකය 2007 වසරේ පළමු කාර්තුව තුළ සියයට 7.1 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත. දේශීය වෙළෙඳ කර්මාන්තය සියයට 6.4 කින් වර්ධනය වී ඇති අතර අපනයන වෙළෙඳාම සියයට 7.7 කින් වර්ධනය වී ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන තිරසාර වර්ධනයක් පිළිබිඹු කරමින් සෘජු දුරකථන සහ ජංගම දුරකථන සැපයීම අනුපිළිවෙළින් සියයට 52.4 කින් සහ සියයට 61 කින් මෙම කාලය තුළ වර්ධනය වී ඇත. බැංකු සහ රක්ෂණ කටයුතුවල ප්‍රසාරණය පිළිඹිබු කරමින් මූල්‍ය අංශය සියයට 6.5 කින් වර්ධනය වී ඇත. ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම තහවුරු කිරීමත් සමඟ 2006 වසරේ පළමු කාර්තුව තුළ පැවති සියයට 6.7 ක වර්ධනය හා සැසඳීමේදී රාජ්‍ය සේවා සැපයීම සියයට 7.6 කින් කින් වර්ධනය වී ඇත.

වගුව **2.1- දළ දේශීය නිෂ්පාදිතය – ආංශික සංයුතිය (2002) ස්ථාවර මිළ ගණන් - (රු. මිලියන.)**

| | **2006 පළමු කාර්තුව** | **2007 පළමු කාර්තුව** |
|---|---|---|
| **කෘෂි කර්මාන්තය,වන වගාව හා ධීවර කර්මාන්තය** | **73,915** | **73,900** |
| **කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදන හා වන වගාව** | **69,096** | **67,747** |
| තේ | 6,729 | 5,534 |
| රබර් | 744 | 822 |
| පොල් | 7,103 | 7,161 |
| සුළු අපනයන භෝග | 1,858 | 1,774 |
| වී | 18,760 | 17,303 |
| උස් බිම් වගා | 9,735 | 10,174 |
| පළතුරු සහ එළවළු | 13,717 | 13,972 |
| පශු සම්පත් | 3,872 | 4,107 |
| අනෙකුත් කෘෂි භෝග | 3,643 | 3,779 |
| දර හා වනාන්තර | 2,934 | 3,121 |
| **ධීවර කර්මාන්තය** | **4,819** | **6,153** |
| **කර්මාන්ත** | **144,519** | **154,637** |
| **පතල් හා කැණීම්** | **9,429** | **10,763** |
| **නිෂ්පාදන** | **93,644** | **98,685** |
| සැකසුම් කර්මාන්ත | 3,675 | 3,555 |
| කර්මාන්ත ශාලා | 83,700 | 88,553 |
| කුඩා කර්මාන්ත | 6,269 | 6,577 |
| **විදුලිය, ගෑස් සහ ජලය** | **10,686** | **11,492** |
| විදුලිය | 9,260 | 9,760 |
| ගෑස් | 882 | 1,148 |
| ජලය | 544 | 584 |
| **ඉදිකිරීම්** | **30,760** | **33,697** |
| **සේවා** | **306,150** | **327,792** |
| **තොග සහ සිල්ලර වෙළෙඳාම** | **127,875** | **134,403** |
| ආනයන වෙළෙඳාම | 42,635 | 43,442 |
| අපනයන වෙළෙඳාම | 22,168 | 23,883 |
| දේශීය වෙළෙඳාම | 63,072 | 67,078 |
| **හෝටල් හා ආපන ශාලා** | **1,933** | **1,830** |
| **ප්‍රවාහන හා සංනිවේදන** | **63,746** | **71,077** |
| ප්‍රවාහන | 54,917 | 60,731 |
| ගුදම් සේවා, වරාය හා සිවිල් ගුවන් සේවා | 3,095 | 3,561 |
| තැපැල් හා විදුලි සංදේශ | 5,736 | 6,784 |
| **බැංකු, රක්ෂණ හා දේපල වෙළෙඳාම් ආදිය** | **45,334** | **49,231** |
| **නිවාස අයිතින්** | **17,867** | **18,065** |
| **රාජ්‍ය අංශයේ සේවා** | **37,291** | **40,141** |
| **පුද්ගලික අංශයේ සේවා** | **12,103** | **13,046** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **524,583** | **556,329** |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව*

**රැකියා වියුක්තිය අඩු වීමේ ප්‍රවණතාව**

- පසුගිය වසර 3 තුළ තිරසාරව පැවති ඉහළ ආර්ථික වර්ධන වේගයත් සමඟ පසුගිය වසරේ පළමු කාර්තුව තුළ පැවති සියයට 7.2 ක රැකියා වියුක්තිය හා සැසදීමේදී 2007 වසරේ පළමු කාර්තුව තුළ එය සියයට 6.8 දක්වා තව දුරටත් අඩු වී ඇත. 2007 වසරේ පළමු කාර්තුව තුළ කර්මාන්ත සහ සේවා අංශයේ රැකියා නියුක්තිය 39,000 කින් පමණ වැඩි වී තිබුණි.

වගුව **2.2**

**රැකියා වියුක්ති අනුපාතය**

| **කාල පරිච්ඡේදය** | **අනුපාතය** |
|---|---|
| 2002 | 8.8 |
| 2003 | 8.1 |
| 2004 | 8.1 |
| 2005 | 7.2 |
| 2006 පළමු කර්තුව | 7.2 |
| 2007 පළමු කාර්තුව | 6.8 |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව*

**උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයක්**

- මිළ පීඩනය අවම කිරීම සඳහා ගන්නා ලද රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග මෙන්ම ශ්‍රී ලංකාවේ උද්ධමනය වෙනස් වන ආකාරය පිළිබිඹු කරමින් අපේක්ෂිත අන්දමින් මෙම වසරේ පළමු මාස කිහිපයට පසුව උද්ධමන අනුපාතිකය අඩුවීම පෙන්නුම් කර ඇත.

- දැඩි මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වා ගනිමින්, අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා ලබාදුන් බදු සහන හේතුවෙන්, පසුගිය මාස කිහිපය තුළ මිළ ගණන්

වැඩිවීමේ සීඝ්‍රතාවය අඩු වීමට හේතු වී ඇත. අතිරික්ත ද්‍රවශීලතාවය ඉවත් කිරීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු මෙහෙයුම් ශ්‍රී ලංකා මහ බැංකුව වැඩි කළ අතර, 2007 පෙබරවාරි මස තුළදී ප්‍රතිපත්තිමය පොළී අනුපාත පදනම් ඒකක 50 කින් තව දුරටත් වැඩි කරන ලදී. 2006 වසරේ පළමු භාගය හා සැසඳීමේදී සියයට 11.7 ක් වූ පොළී අනුපාත 2007 වසරේ අදාල කාලය තුළ සියයට 16.4 ක් වැනි ඉහළ අගයක් දක්වා වැඩි වී ඇත.

**රූප සටහන 2.1**




- ලක්ෂමය පදනම මත ගණනය කරනු ලබන උද්ධමන අනුපාතය 2007 වසරේ ජනවාරි මස පැවති සියයට 20.5 ක ඉහළ අගයේ සිට මැයි මස අවසන් වන විට සියයට 13.7 දක්වා අඩු වී ඇත. දැනට පවතින ප්‍රක්ෂේපණ අනුව 2007 වසර අවසන් වන විට උද්ධමනය සියයට 9-10 දක්වා අඩු වීමට ඇති හැකියාව පෙන්නුම් කරයි.

වගුව 2.3

**ලක්ෂමය උද්ධමන ප්‍රවණතා - %**

| මාසය | කො. පා. මි. ද. | | ශ්‍රී ලංකා පා. මි. ද. | |
|---|---|---|---|---|
| | **2006** | **2007** | **2006** | **2007** |
| ජනවාරි | 8.0 | 20.5 | 3.2 | 17.8 |
| පෙබරවාරි | 7.1 | 19.2 | 3.5 | 18.1 |
| මාර්තු | 6.4 | 19.5 | 4.0 | 18.6 |
| අප්‍රේල් | 9.2 | 16.3 | 5.3 | 16.3 |
| මැයි | 13.2 | 13.7 | 8.4 | |
| ජුනි | 17.7 | | 10.7 | |
| ජුලි | 14.7 | | 9.9 | |
| අගෝස්තු | 15.3 | | 10.9 | |
| සැප්තැම්බර් | 15.4 | | 11.5 | |
| ඔක්තෝබර් | 17.2 | | 12.6 | |
| නොවැම්බර් | 19.8 | | 16.4 | |
| දෙසැම්බර් | 19.3 | | 17.9 | |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

**විදේශීය අංශයේ වර්ධනය**

**අපනයනයන්හි කැපී පෙනෙන වර්ධනය**

- 2006 වසරේ පළමු මාස හතර තුල පැවැති සියයට 8.4 ක වර්ධන වේගය හා සැසඳීමේදි 2007 වසරේ පළමු මාස හතර තුල අපනයන වර්ධනය සියයට 11.5 කින් වැඩි වී ඇති අතර එය 2007 වසර ආරම්භයේදී අපේක්ෂිත වර්ධන වේගය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉක්මවීමක් පෙන්නුම් කරයි. 2007 වසරේ පළමු මාස හතර තුලදි මුළු අපනයන ආදායම ඇ.ඩො.මිලියන 2,252 ක් දක්වා වැඩි වී ඇත.

- සතුටුදායක විදේශ ඉල්ලුම හා ලෝක වෙළඳ පොලෙහි නව අවස්ථා විවෘතවීම, අපනයන ආදයමෙහි කැපී පෙනෙන වැඩි වීමට හේතු වී ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන අගය එකතු කළ නිෂ්පාදන බවට විවිධාංගිකරණය කිරීමත් සමග තේ අපනයනය සියයට 5 කින් වර්ධනය වූ අතර, කෘෂිකාර්මික අපනයන සියයට 11

කින් වර්ධනය වී ඇත. මෙම කාලය තුල සුළු කෘෂිකාර්මික අපනයන සියයට 16.1 කින් වර්ධනය වී ඇත. කාර්මික අපනයන වල සමස්ථ ප්‍රමාණය සියයට 11 කින් වර්ධනය වූ අතර, ඇඟලුම් හා රෙදිපිළි අපනයනය වටිනාකම සියයට 10 කට වඩා වැඩි සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

## ආනයන පිරිවැය අඩුවීම

- සංවර්ධන කටයුතු සඳහා වූ භාණ්ඩ ආනයන වර්ධන ප්‍රවණතාවය නොවෙනස්ව පැවතුන අතර 2006 වසරේ සියයට 15.7 ක් දක්වා වැඩි වූ ආනයනය පිරිවැය 2007 වසරේ පළමු මාස හතර තුල සියයට 7.4 දක්වා අඩු වී ඇත. 2007 වසරේ පළමු මාස හතර තුල ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 11 කින් වැඩි වී ඇත. 2006 වසරේ පළමු මාස හතර තුල ඇ.ඩො.මිලියන 3, 071 ක් වූ ආනයන පිරිවැය හා සැසඳීමේදී 2007 වසරේ අදාල කාලය තුල එම අගය ඇ.ඩො.මිලියන 3,303 දක්වා වැඩි වී ඇත.

- ඛණිජ තෙල් ආනයන පිරිවැය ගෙවුම් ශේෂය සඳහා අඛණ්ඩව වැඩි බලපෑමක් එක් කර ඇත. 2007 වසරේ පළමු මාස හතර තුල ඛණිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය ඇ.ඩො. මිලියන 623 ක් වූ අතර, එය අපනයන ආදායමෙන් සියයට 27 ක් විය. 2007 වසරේ ඉතිරි කාලය සීමාව තුලදි බොර තෙල් මිල වන අඛණ්ඩව වැඩිවීමේ ප්‍රවණතාවය තුල, මෙම වසර අවසන් වන විට ඛණිජ තෙල් සඳහා වැය වෙතැයි අපේක්ෂිත වියදම ඇ.ඩො.මිලියන 2,200 ක් පමණ වන අතර, එය පෞද්ගලික ප්‍රේෂණ ලැබීම් වලට වඩා මඳක් අඩු වෙතැයි අපේක්ෂා කරයි.

## වෙළඳ හිගය

- මෙම ප්‍රවනතාවයන් අනුව 2007 අප්‍රේල් මස වන විට වෙළඳ හිගය ඇ.ඩො.මිලියන 1,050ක් දක්වා වු අතර 2006 වසරේ අදාල කාල පරිච්ඡේදය තුල එම අගය ඇ.ඩො.මිලියන 1,056 ක් විය.

**සේවා සහ මාරු කිරීම් ප්‍රවාහ**

- තොරතුරු තාක්ෂණ අපනයනය සහ ව්‍යාපාර සැකසුම් සේවා බාහිර සේවය ලබාගැනීම වැනි සන්නිවේදන සේවා යනාදි කැපී පෙනෙන නව සේවා සහ වරාය කටයුතු වලින් ලැබුණු ඉපැයීම් හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය අඛණ්ඩව පැවතුණි. සංචාරක ක්ෂත්‍රයේ ඉපයීම් වල අඩු වීම අවම කිරීම සඳහා මෙය හේතු වී ඇත.
- පෞද්ගලික ප්‍රේෂණ බැංකු ක්‍ෂත්‍රය තුළින් එක්රැස්කිරීම් වැඩිවීම, ශ්‍රමිකයින්ගෙන් ලැබෙන ප්‍රේෂණ වැඩිවීම සහ විගමණික ශ්‍රමිකයින්ගෙන් ලැබෙන සාමාන්‍ය ඉපයීම් වැඩිවීම පිළිබිඹු කරමින් 2007 වසරේ පළමු මාස හතර තුල පෞද්ගලික ප්‍රේෂණ ඇ.ඩො.මිලියන 864 ක් දක්වා වැඩි වූ අතර, 2006 වසරේ අදාල කාලය හා සැසඳීමේදි එය සියයට 17.4 ක වැඩි වීමක් වේ.

**සමස්ථ ශේෂය සහ නිල සංචිත**

- 2006 වසරේ මැයි මස අවසන් වන විට ඇ.ඩො.මිලියන 158 ක් වූ ගෙවුම් ශේෂයේ අතිරික්තය හා සැසඳීමේදී 2007 වසරේ මැයි මස අවසන් වන විට ගෙවුම් ශේෂය අතිරික්තය ඇ.ඩො.මිලියන 250 ක් දක්වා වැඩි වී තිබුණි.
- 2006 වසර අවසන් වන විට ඇ.ඩො.බිලියන 2.5 ක් වූ දළ නිල සංචිත ප්‍රමාණය 2007 වසරේ මැයි මස අවසන් වන විට ඇ.ඩො.බිලියන 2.8 ක් දක්වා වැඩි වී ඇති අතර, 2007 වසරේ අප්‍රේල් මස අවසන් වන විට මුළු සංචිත ප්‍රමාණය ඇ.ඩො.බිලියන 4 දක්වා වැඩි වී ඇත. නිල සංචිත හා මුළු සංචිත ප්‍රමාණය අනුපිළිවෙලින් මාස 03 ක් හා මාස 4.7 ක් සඳහා වන ආනයන සඳහා ප්‍රමාණවත් විය.

## 2.4 වගුව

### විදේශ වෙළඳාමේ කාර්ය සාධනය - (ජනවාරි - අප්‍රේල්)

ඇ.ඩො.මිලියන

| | 2006 | 2007 |
|---|---|---|
| **අපනයන** | **2,021** | **2,253** |
| කෘෂිකාර්මික අපනයන | 384 | 430 |
| තේ | 267 | 282 |
| අනෙකුත් | 116 | 148 |
| කාර්මික අපනයන | 1,574 | 1,756 |
| ආහාර පාන වර්ග හා දුම්කොළ | 130 | 144 |
| රෙදිපිළි හා ඇඟලුම් | 899 | 996 |
| රබර් නිශ්පාදන | 115 | 133 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 98 | 105 |
| අනෙකුත් | 332 | 378 |
| ඛණිජ නිෂ්පාදන | 51 | 47 |
| වර්ග නොකළ | 11 | 20 |
| **ආනයන** | **3,077** | **3,304** |
| පාරිභෝගික භාණ්ඩ | 560 | 652 |
| ආහාර හා පාන වර්ග | 273 | 336 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 288 | 315 |
| මෝටර් රථ සහ යතුරු පැදි | 90 | 107 |
| අතර මැදි භාණ්ඩ | 1,790 | 1,828 |
| ඛණිජ තෙල් | 639 | 632 |
| පොහොර | 69 | 33 |
| රසායනික ද්‍රව්‍ය | 77 | 94 |
| රෙදිපිළි හා ඇඟලුම් | 438 | 489 |
| දියමන්ති | 71 | 79 |
| අනෙකුත් අතර මැදි භාණ්ඩ | 496 | 500 |
| ආයෝජන භාණ්ඩ | 697 | 774 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 354 | 356 |
| ප්‍රවාහන උපකරණ | 113 | 124 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 175 | 215 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 55 | 80 |
| වර්ග නොකළ | 31 | 50 |
| **වෙළඳ හිගය** | **(1,056)** | **(1,051)** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

මුල්‍ය අංශයේ වර්ධනය

- මුදල් ප්‍රතිපත්ති වැඩි කිරීම හේතුවෙන් මුල්‍ය වෙළඳ පොලෙහි පොලී අනුපාත කැපී පෙනෙන ලෙස ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. එමගින් රජයේ ණය සාධන පත්‍ර ඉල්ලුම් ව්‍යුහය වෙනස් වූ අතර කෙටි කාළීන ණය සාධන පත්‍ර මත ඇති ඉල්ලුම වැඩි විය.
- 2007 වසරේ පළමු කාර්තුව තුල සියයට 17.3 ක වර්ධන වේගයක් පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂිත මට්ටමින් සංචිත මුදල් ප්‍රමාණය පවත්වා ගෙන ඇත. සංචිත මුදල් ප්‍රමාණයෙහි ප්‍රසාරණය මුළුමනින්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ වත්කම් වැඩිවීම හේතුවෙන් සිදු වී ඇති අතර, භාණ්ඩාගාර බිල්පත් ලබාගැනීම අඩුවීම පෙන්නුම් කරමින් ශුද්ධ දේශීය වත්කම් අඩු වී ඇත.
- පුළුල් මුදල් ප්‍රසාරණය වීමේ වේගය අඩු වීමක් පෙන්නුම් කළ 2007 වසරේ අප්‍රේල් මස වන විට එය සියයට 16.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී. විදේශ නොවන වත්කම් හා ශුද්ධ දේශීය වත්කම් වල ප්‍රසාරණය, පළමු මාස 04 තුල මුදල් ප්‍රසාරණයට හේතු වී ඇත. බැංකු කේෂත්‍රයේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය වැඩි වූ අතර, එය මෙම කාලය තුල මුදල් ප්‍රසාරණයේ සියයට 32 කට පමණ හේතු වී ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ වත්කම් වැඩිවීම මෙයට මුළුමණින්ම හේතු වී ඇත.
- අපේක්ෂිත සීමාව ඉක්මවා යමින් 2007 වසරේ පළමු මාස හතර තුල රජයට ලබාදුන් මුළු ණය ප්‍රමාණය රු. බිලියන 27 කින් අඩු වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය අඩු වීම මගින් මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් පිළිබිඹු කර ඇත.
- ආර්ථික ක්‍රියාකරකම් ප්‍රසාරණය වීම සහ බැංකු මගින් ලබාදුන් ණය ලබාදීම් දිරි ගැන්වීමේ වැඩසටහන් අනුව පුද්ගලික අංශය සඳහා ලබාදුන් ණය ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක අඛණ්ඩව පැවතුණි.

# 3 වන පරිච්ඡේදය

# විදේශ ආධාර

**විදේශ ආධාර උපයෝජන**

- 2007 වර්ෂයේ මැයි මස අවසානය වන විට, ණය හා ප්‍රධාන ගිවිසුම් ප්‍රදායකයන් විසින් ශ්‍රී ලංකාවට ලබා දීමට එකඟ වී ඇති මුළු ආධාර ප්‍රමාණය ඇ. ඩො. මිලියන 874 කි. ( වගුව 3.1) ව්‍යාපෘති ණය ඇ. ඩො. මිලියන 803 ක් සහ ප්‍රදාන ඇ. ඩො. මිලියන 71 කින් ද එම ආධාර ප්‍රමාණය සමන්විත වේ.

**3.1 වගුව**

**එකඟතාවය පළ කෙරුණු විදේශාධාර (2007 ජන. - මැයි)**

| ප්‍රදායකයා | ඇ. ඩො. මිලියන |
|---|---|
| ජපානය | 362.8 |
| ආසියානු සංවර්ධන බැංකුව | 300.0 |
| චීනය | 66.1 |
| ලෝක බැංකුව | 32.5 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල | 22.9 |
| ස්පාඤ්ඤය | 17.0 |
| ජර්මනිය | 17.2 |
| අපනයන ණය | 12.7 |
| අනෙකුත් | 43.1 |
| මුළු මුදල | **874.3** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## **3.1** රූපසටහන

### 2007 ජනවාරි සිට මැයි දක්වා එකඟතාවය පළ කෙරුණු විදේශාධාර - ප්‍රදායකයා අනුව




- මහාමාර්ග, ජලය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ජපන් රජය ඇ.ඩො. මිලියන 338 ක් ලබා දීමට එකඟ වී ඇත. ඇ. ඩො. මිලියන 187ක මුදල් වෙන් කිරීමක් සහිත මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, ජපන් ආධාර සහිත එම ව්‍යාපෘති සමූහය අතරින් විශාලතම ව්‍යාපෘතිය වේ. ජල සම්පාදන අංශයේ සංවර්ධනය සඳහා ජපන් රජය ඇ. ඩො. මිලියන 113ක් වෙන් කර ඇත. මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය, උතුරු කොළඹ නාගරික ප්‍රදේශ ජල සම්පාදන ව්‍යාපෘතියේ දෙවන අදියර, මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා මහනුවර නගරයේ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය මෙයට ඇතුලත් වේ.

**3.2 වගුව**

**ණය/ප්‍රදාන අත්සන් කරන ලද ගිවිසුම් - 2007.01.01 – 2007.05.31 (අංශමය වශයෙන්)**

| අංශය | රට | ව්‍යාපෘතියේ නම | ණය ඇ.ඩො.මි | ප්‍රදාන ඇ.ඩො.මි |
|---|---|---|---|---|
| මාර්ග හා පාලම් | ජපානය | මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය. | 186.6 | |
| | ජපානය | මන්නාරම් පාළම ඉදිකිරීම සහ යාබද සපත්තු පාලම වැඩිදියුණු කිරීම සඳහා සවිස්තරාත්මක නිර්මාණ සැලසුම් කිරීම | | 15.7 |
| ග්‍රාමීය සංවර්ධනය | ජපානය | දිළිඳුකම පිටුදැකීමේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | 34.8 | |
| ජල සම්පාදනය | ජපානය | ජල සම්පාදන අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 112.7 | |
| | ඔස්ට්‍රියාව | මහ කොළඹ ජලාපවාහන පද්ධිතය ප්‍රතිසංස්කරණය කිරීමේ 2 වන අදියර | 12.7 | |
| | ස්පාඤ්ඤය | ගාල්ල හා මීගමුවේ ජල පවිත්‍රාගාර දෙකක් ඉදිකිරීමට සැලසුම් කිරීම, සැපයීම හා ස්ථාපනය කිරීම | 17.0 | |
| කෘෂිකර්මාන්තය | ජපානය | ජපාන 2 KR ආහාර නිෂ්පාදන ප්‍රදාන - 2006 | | 2.8 |
| | අහාර හා කෘෂිකර්ම සංවිධානය | ආහාර සුරක්ෂිතභාවය සඳහා දෙමුහුන් බීජ සංවර්ධන වැඩ සටහන | | 0.3 |
| | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන | 22.9 | |
| | ජර්මනිය | ගැටුම්වාදී තත්ත්වයෙන් මිදුණු ප්‍රදේශ වල ආහාර සුරක්ෂණය | | 3.7 |
| නිවාස හා පුනරුත්ථාපනය | ප්‍රංශය | ඉදිකිරීම් අංශ සහාය ව්‍යාපෘතිය (පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ) | 13.6 | |
| | ජර්මනිය | උතුරු පුනරුත්ථාපන ව්‍යාපෘතිය | | 1.3 |
| | ලෝක බැංකුව | පුත්තලම නිවාස ව්‍යාපෘතිය | 32.5 | |
| | ජර්මනිය | ගැටුම් අධ්‍යයනය සඳහා සම්පත් ජාලය | | 3.6 |
| දුම්රිය | චීනය | මගී දුම්රිය මැදිරි 100 ක් සැපයීමේ ව්‍යාපෘතිය | 27.2 | |
| | චීනය | ඩීසල් බහුවිධ ඒකක 15 ක් සැපයීමේ ව්‍යාපෘතිය | 38.9 | |
| විදුලිබල හා ශක්තිය | ඇමෙරිකා එක්සත් ජනපදය | තෙල් හා ගෑස් නියාමක ව්‍යාපෘතිය | | 0.5 |

**3.2 වගුව- *තවදුරටත්***

| අංශය | රට | ව්‍යාපෘතියේ නම | ණය ඇ.ඩො.මි | ප්‍රදාන ඇ.ඩො.මි |
|---|---|---|---|---|
| වරාය හා නාවික | ආසියානු සංවර්ධන බැංකුව | කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 300.0 | |
| | නෙදර්ලන්තය | ඕරෙට් (ORET) වැඩ සටහන යටතේ 7400 DWT බහු කාර්යය යාත්‍රා දෙකක් සැපයීම | | 11.7 |
| සෞඛ්‍ය, අධ්‍යාපන හා සමාජ සුභසාධන | එක්සත් ජාතින්ගේ ළමා අරමුදල | එක්සත් ජාතින්ගේ ළමා අරමුදල ශ්‍රී ලංකා වැඩ සටහන - 2007 | | 11.8 |
| | ජර්මනිය | සමාජ සමවායසය සඳහා අධ්‍යාපනය | | 3.3 |
| වෙනත් | ජපානය | ජපාන ව්‍යාපෘති නොවන ප්‍රදාන | | 10.2 |
| | එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන | ආයතන සවිබල ගැන්වීම - අදියර V | | 0.1 |
| | ජර්මනිය | ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතිය සංවර්ධනය | | 5.3 |
| | ස්වීඩනය | තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | | 1.1 |
| | නෝර්වේ | ශ්‍රී ලංකාවේ මහද්වීපික තටාකයේ සීමාව නිර්ණය කිරීම | 4.0 | |
| **උප එකතුව** | | | **802.9** | **71.40** |
| **මුළු එකතුව** | | | **874.3** | |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

- ආර්ථිකමය වශයෙන් පසුගාමී ප්‍රදේශයන්හි ජාතික හා පළාත්බද මහාමාර්ග පුනරුත්ථාපනය කිරීම තුළින් ප්‍රාදේශීය අසමානතාවයන් දුරලීම සඳහා ද ජපන් රජය දිළිඳුකම පිටුදැකීම සඳහා වූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ඇ. ඩො. මිලියන 35 ක් වෙන් කොට ඇත. ජපන් ප්‍රදානයන් ඇතුලත් සහන වැඩසටහන යටතේ මන්නාරම් දූපත, ප්‍රධාන දිවයින හා සම්බන්ධ කරන පාලමක් ඉදිකිරීමටත්, එම මාර්ගය වැඩිදියුණු කිරීම සඳහාත් ඇ. ඩො. මිලියන 15.9 ක් ලබා දී තිබේ.

- කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ. ඩො. මිලියන 300 ක් සපයා දී තිබේ. දියකඩනයක් ඉදිකිරීම, පිවිසුම් මාර්ග හා වරාය තටාකය ගැඹුරු කිරීම, සබ්මැරීන තෙල් නල මාර්ගය ප්‍රතිස්ථාපනගත කිරීම, උපයෝගී පහසුකම් සහ නාවුක ආධාරක ඉදිකිරීම වැනි කටයුතු සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ මූලාධාර සැපයිණි. පුද්ගලික අංශයේ මූලාධාර සහිතව පළමු බහාලුම් පර්යන්තය ඉදිකිරීමටත් එයට සම්බන්ධ උපාංග මිලදී ගැනීමත් සිදු කෙරෙනු ඇත. රජය විවෘත තරඟකාරී ලංසු කැඳවීම මගින් අවම වශයෙන් පළමු පර්යන්ත උපාංග 2 සඳහා අවසර ලබා දී තිබේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ රාජ්‍ය - පුද්ගලික හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යමින් කොළඹ වරාය කේන්ද්‍රය කොට ගත් ප්‍රති නැව්ගත කිරීමේ වරායක් ලෙස කොළඹ වරාය විශාල කර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම තරඟකාරිත්වයට පත් කරමින් රටේ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමකි.

- දුම්රිය අංශය සංවර්ධනය සඳහා ඩීසල් එන්ජින් 15 ක් හා දුම්රිය මැදිරි 100 ක් චීන රජයේ අරමුදල් මගින් ලබා ගැනීමට කටයුතු කෙරෙනු ඇත. මෙම ඩීසල් එන්ජින් යොදා ගනිමින් කොළඹ උප නාගරික දුම්රිය සේවාව සඳහා පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. දුර ධාවන හා නගරාන්තර සේවාවන් සඳහා මෙම නව දුම්රිය මැදිරි යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

- අභ්‍යන්තර අවතැන් වූ හා ප්‍රදේශයේ අනෙකුත් පවුල් 20,600 ක් සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් හා නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලෝක බැංකුව විසින් ඇ. ඩො. මිලියන 33 ක් ලබා දෙන ලදී.

**ගිවිසුම්ගත එහෙත් නිදහස් කර නොමැති ශේෂයන්**

- පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළු රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා 2007 වසරේ මැයි මාසය අවසානය වන විට ගිවිසුම්වලට එළඹ ඇති එහෙත් නිදහස් කර නොමැති විදේශ ආධාර ශේෂය ඇ. ඩො. බිලියන 4.7 කි. මෙම ආධාර වසර 3-5 ක කාල වකවානුවක් තුළ ක්‍රියාවට නැංවීමට සැළසුම් කරන ලද ව්‍යාපෘති සඳහා භාවිතා කෙරේ. සාමාන්‍යයෙන් ගිවිසුම්ගත මුදලින් පහෙන් එකක් හෝ හතරෙන් එකක් එක් වර්ෂයක් තුළ උපයෝජනය කිරීම සතුටුදායක තත්ත්වයක් වේ. අංශමය වශයෙන් එකී මුදල උපයෝජනය කරනු ලබන ආකාරය 3.3 වගුවෙහි දක්වා ඇත.

**3.3 වගුව**

**එකඟතාවය පළ කර උපයෝජනය කිරීමට ඇති ශේෂය**

2007-05-31 දිනට අංශමය වශයෙන්

| අංශය | ඇ. ඩො. මිලියන | මුළු මුදලේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|
| කෘෂිකර්ම, වාරිමාර්ග, වන සම්පත්, ඉඩම් හා පරිසර | 267.1 | 5.7 |
| මහාමාර්ග, පාලම් , වරාය හා ගුවන් තොටුපල සේවා | 1,342.2 | 28.0 |
| මූල්‍ය කළමනාකරණය | 139.5 | 3.0 |
| සෞඛ්‍ය, සමාජ සුබසාධනය, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු | 297.8 | 6.0 |
| විදුලිබල හා බලශක්ති | 590.3 | 12.0 |
| සංචාරක, ජනමාධ්‍ය හා සංස්කෘතික කටයුතු | 39.1 | 0.8 |
| ධීවර | 42.4 | 0.9 |
| නිවාස සහ නාගරික සංවර්ධනය | 79.3 | 1.8 |
| වෙළෙඳ, කර්මාන්ත සංවර්ධනය හා තොරතුරු තාක්ෂණය | 96.9 | 1.9 |
| වැවිලි | 39.2 | 0.8 |
| පුද්ගලික අංශය සංවර්ධනය | 112.0 | 2.3 |
| පුනරුත්ථාපනය | 181.2 | 4.0 |
| ග්‍රාමීය සංවර්ධන | 125.1 | 3.0 |
| සුනාමි පුනරුත්ථාපන | 916.6 | 19.0 |
| ජලසම්පාදන හා සනීපාරක්ෂක | 424.7 | 9.0 |
| වෙනත් | 70.2 | 1.6 |
| **මුළු එකතුව** | **4,763.6** | **100** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**විදේශ ආධාර උපයෝජනය**

- ව්‍යාපෘති ණය හා ප්‍රදානයන් වශයෙන් 2007 වසරේ මැයි මාසය අවසානය වන විට සමස්ත ආධාර ලැබීම් ප්‍රමාණය ඇ. ඩො. මිලියන 331 ක් විය. සම්පූර්ණ විදේශ ආධාර ලබාදීම් වලින් ඇ. ඩො. මිලියන 219 ක් ව්‍යාපෘති ණය වශයෙන්ද ඇ. ඩො. මිලියන 112 ක් ප්‍රදානයන් වශයෙන් ද විය. 2007 වර්ෂයේ සමාලෝචන කාලයේදී එක් එක් ප්‍රදායකයා සිදුකළ විදේශ ආධාර උපයෝජනය 3.4 වගුවේ දැක්වේ

**3.4 වගුව**

**විදේශ ආධාර උපයෝජනය (2007 ජනවාරි සිට මැයි 31 දක්වා)**

ඇ. ඩො. මිලියන

| ප්‍රදායකයා | මුදල |
|---|---|
| ජපානය | 75.4 |
| ලෝක බැංකුව | 52.4 |
| ආසියානු සංවර්ධන බැංකුව | 50.1 |
| ජර්මනිය | 36.1 |
| ස්වීඩනය | 11.5 |
| ඉන්දියාව | 15.9 |
| ඩෙන්මාර්කය | 14.9 |
| අපනයන ණය ලබාදෙන ආයතන | 26.8 |
| වෙනත් | 47.9 |
| මුළු මුදල | **331.0** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

- ජපන් රජය සංවර්ධන හවුල්කරුවන් අතර ප්‍රමුඛස්ථානයක් ගනිමින් 2007 මැයි මස 31 වන විට ඇ. ඩො. මිලියන 75.4 ක උපයෝජනයක් කර ඇත. එය සමස්ත උපයෝජනයෙන් සියයට 23 කි. මෙම කාලසීමාව තුළ ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව ඇ. ඩො. මිලියන 100 කට වඩා වැඩි උපයෝජනයක් වාර්තා ගත කොට ඇත. සංවර්ධන ආධාර ලෙස ජර්මනිය විසින් ඇ. ඩො. මිලියන 36.1 ක්ද උපයෝජනය කොට ඇත.

## 3.2 රූප සටහන

## ආධාර සපයන්නන් අනුව විදේශ ආධාර ලබා දීම් යෙදවුම්




**විදේශ ණය**

- 2007 වසරේ මැයි මස අවසන් වන විට රජයේ මුළු විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො.බිලියන 10.7 ක් විය. 2006 වසර අවසන් වන විට පැවති ණය ප්‍රමාණය හා සැසඳීමේදි මෙය ඇ.ඩො.මිලියන 100 ක වැඩි වීමක් වේ.

- 2007 මැයි මස 31 දින වන විට මුළු විදේශ ණය සේවාකරණ වියදම ඇ.ඩො.මිලියන 383 ක් දක්වා වැඩි වී ඇත. ඉන් ඇ.ඩො.මිලියන 311 ක් ප්‍රාග්ධන ගෙවීම් වූ අතර ඉතිරි ඇ.ඩො. මිලියන 72 පොලී සහ අනෙකුත් ගාස්තු සඳහා ගෙවීම් විය. මෙම කාලය තුල සිදු කරන ලද ණය සේවා කරන වියදම් 2007 වසර සඳහා ඇස්තමේන්තුගත ණය සේවාකරණ වියදම වන ඇ.ඩො.මිලියන 860 න් සියයට 44.5 ක් විය.

**ශ්‍රී ලංකා සංවර්ධන සමුළුව**

- ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ''ශ්‍රී ලංකා සංවර්ධන සමුළුව 2007'', ශ්‍රී ලංකාවේ ගාල්ලේදී, 2007 ජනවාරි 29-30 යන දිනයන්හිදී පැවැත්වූ අතර රටවල් 50 කට වැඩි ප්‍රමාණයක් හා ආධාර සපයන ජාත්‍යන්තර ආයතන ඒ සඳහා සහභාගි විය. ''මහින්ද චින්තන: නව ශ්‍රී ලංකාවක් කරා - දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව 2006-2016'', පශ්චාත් සුනාමි ප්‍රතිප්‍රාප්ති හා ප්‍රතිසංස්කරණ අභියෝග සහ මතුවන ගැටළු, ''ගම නැගුම'' සහ සංවර්ධනයෙන් අඩු ප්‍රදේශ සංවර්ධනය හා සංවර්ධනය සහ සාමය අතර සම්බන්ධතාවය පිළිබඳව ආධාර සපයන සියළු ප්‍රජාවන් සමග පුළුල් උපදේශාත්මක ක්‍රියාවලියක නිරතවීමට මෙම සමුළුව මගින් අවස්ථාව උදාකර දී ඇත. මෙහිදි රජය විසින් කරන ලද ඉදිරිපත් කිරීම් වලදි රාජ්‍ය ආරක්ෂාව, නීතිමය හා සාමය, ගැටුම්, ත්‍රස්තවාදය හා සාමය, මානව අයිතිවාසිකම්, මානුෂීය සහන සැලසීම සහ නැවත පදිංචි කිරීමේ අභියෝග, ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීම, සිවිල් සමාජය හා ආධාර සැපයීමේ කාර්යභාරය අඛණ්ඩව පැවතීම පිළිබඳව විශේෂ අවධානය යොමුකරන ලදී. 2006 වසරේ සංවර්ධන ආධාර යෙදවීමේ ප්‍රගතිය සහ ඇතැම් ක්‍රියාත්මක කිරීමේ අභියෝග පිළිබඳවද මෙම සමුළුවේදී සමාලෝචනය කරන ලදි.